සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

තෙවන වාර පරීක්ෂණය
மூன்றாம் கால சோதனை - 2026
Third Term Test

| ශ්‍රේණිය / தரம் / Grade | 13 | විෂයය / பாடம் / Subject | ආර්ථික විද්‍යාව | පත්‍රය / வினாத்தாள் / Paper | I | පැය / மணித்தியாலம் / Hours | 02 |
|---|---|---|---|---|---|---|---|

උපදෙස් :
* වඩාත් නිවැරදි පිළිතුර තෝරා ඔබට සපයා ඇති පිළිතුරු වරණ පත්‍රයේ සටහන් කරන්න.

1. නිෂ්පාදන සාධකයක් ලෙස "භූමිය" යන්නෙහි ආර්ථික විද්‍යාත්මක අර්ථය වඩාත් නිවැරදිව පෙන්වා දෙන්නේ පහත සඳහන් කවර වරණයෙන්ද ?
   (1) කෘෂිකාර්මික නිෂ්පාදනය සඳහා සෘජුවම යොදා ගනු ලබන සියලුම ස්වාභාවික සම්පත්
   (2) මානව උත්සාහයෙන් ස්වායත්තව පවතින සියලුම ස්වභාදහමේ දායාදයන්
   (3) භාණ්ඩ හා සේවා නිෂ්පාදනය සඳහා භාවිතා කළ හැකි සියලුම ස්වාභාවික සම්පත්
   (4) වෙළඳපලේ විනිමය අගයක් පවතින සියලුම ස්වාභාවික සම්පත්
   (5) පුද්ගලයන් හෝ රජය සතු සියලුම ස්වභාවික සම්පත්

2. ශ්‍රම විභජනය සහ ආර්ථික කාර්යක්ෂමතාව අතර සම්බන්ධතාවය වඩාත් හොඳින් විස්තර කරනු ලබන්නේ පහත සඳහන් කවර වරණයෙන්ද ?
   (1) ශ්‍රම විභජනය මගින් නිෂ්පාදනය සඳහා අවශ්‍ය සම්පත්වල මුළු ප්‍රමාණය අඩු කරයි
   (2) ශ්‍රම විභජනය මගින් සේවකයින්ට සියලුම නිෂ්පාදන කාර්යයන් වඩාත් ඵලදායි ලෙස කිරීමට ඉඩ සලසයි
   (3) සේවකයින්ට නිශ්චිත කාර්යයන් සඳහා විශේෂීකරණය වීමට ඉඩ සැලසීම මගින් ශ්‍රම විභජනය ඵලදායිතාවය ඉහළ නංවයි
   (4) ශ්‍රම විභජනය මගින් තාක්ෂණික දියුණුවේ අවශ්‍යතාවය නැතිකර දමයි
   (5) ශ්‍රම විභජනය මගින් සියලුම සේවකයින්ට සමාන වැටුප් සහතික කරයි.

3. පහත සඳහන් ඒවායින් නිෂ්පාදන හැකියා වක්‍රයේ විතැන්වීමකට හේතුවක් නොවන්නේ කුමක්ද?
   (1) මූර්ත දළ දේශීය නිෂ්පාදිතයේ (Real GDP) අඛණ්ඩ අඩුවීමක්
   (2) සුළි කුණාටුවක් හේතුවෙන් වාරි පද්ධති විනාශවීම.
   (3) ප්‍රයෝජනයට නොගත් ඉඩම්වල පොල් වගා කිරීම.
   (4) රාජ්‍ය ආයතන ඩිජිටල්කරණය කිරීම.
   (5) නව ප්‍රතිසංස්කරණ හේතුවෙන් අධ්‍යාපන පද්ධතියේ ඵලදායීතාවය ඉහළ යාම.

4. සමාජ වෙළඳපොළ ආර්ථික ක්‍රමයක රජයේ කාර්යභාරය වඩාත් හොඳින් විස්තර කරන්නේ, පහත සඳහන් කවර වරණයෙන්ද ?
   (1) සියලුම භාණ්ඩ හා සේවා නිෂ්පාදනය සහ බෙදාහැරීම කෙරෙහි සෘජු පාලනයක් ක්‍රියාත්මක කිරීම.
   (2) මිල යාන්ත්‍රණය වෙනුවට පරිපාලනමය සම්පත් වෙන් කිරීම් ආදේශ කිරීම.
   (3) සමාජ ආරක්ෂණය සහ සාධාරණ තරගකාරීත්වය පවත්වා ගනිමින් වෙළඳපළවල් ක්‍රියාත්මක වීමට ඉඩ සැලසීම.
   (4) ව්‍යාපාර වල රජයේ අයිතිය හරහා ආදායම් අසමානතාවයන් තුරන් කිරීම.
   (5) සියලුම කර්මාන්ත සඳහා නිෂ්පාදන ඉලක්ක තීරණය කිරීම.

5. පහත කුමන වරණය, යම් කිසි භාණ්ඩයක මිල වැඩිවූ විට, එම භාණ්ඩයේ සැපයුම් ප්‍රමාණය වැඩිවීම සඳහා බල නොපාන්නේ ද,
   (1) සම ජාතිය නොවන නිෂ්පාදන සාධක නිෂ්පාදන ක්‍රියාවලිය සඳහා භාවිතා කිරීම.
   (2) කෙටි කාලීන නිෂ්පාදනය ක්‍රියාවලියක ආන්තික නිෂ්පාදනය පහළ බැසීම
   (3) සම්පත් ආදේශන අනුපාතය ඉහළ යාම.
   (4) දෙන ලද කාලසීමාව තුළදී භාණ්ඩ ගබඩා කර අනාගතයේදී ලාභ ලැබීමට ඇති අපේක්ෂාව
   (5) නිෂ්පාදන ආයතන වල ලාභ අපේක්ෂිත චේතනාව


iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

6. යම් කිසි භාණ්ඩයක මිල 30% කින් වෙනස්වන විට එම භාණ්ඩයේ ඉල්ලුම් ප්‍රමාණය A විසින් 20% කින්ද, B විසින් 60% කින්ද වෙනස් කරනු ලබයි නම් , A සහ B ගේ හැසිරීමට හේතුවන්නේ,

(1) සලකා බලන භාණ්ඩයට A ගේ කැමැත්ත B ට වඩා අඩුවීම.
(2) සලකා බලන භාණ්ඩය සඳහා B ට වඩා A ට අඩු ආදේශක සංඛ්‍යාවක් පැවතීම.
(3) සලකා බලන භාණ්ඩය සඳහා A විසින් තම ආදායමින් B ට වඩා වැඩි ප්‍රතිශතයක් වැය කිරීම.
(4) A විසින් සලකා බලන භාණ්ඩයේ මිල අනාගතයේ වැඩි වේ යැයි අපේක්ෂා කරන අතර B විසින් අඩු යැයි අපේක්ෂා කිරීම.
(5) A විසින් සලකා බලන භාණ්ඩය B ට වඩා පටු ලෙස නිර්වචනය කර තිබීම.

7. A භාණ්ඩයේ මිල රු. 32 සිට රුපියල් 40 දක්වා වැඩි වූ B භාණ්ඩයේ ඉල්ලුම ඒකක 160 සිට 140 දක්වා අඩු විය. A හා B භාණ්ඩ අතර හරස් මිල ඉල්ලුම් නම්‍යතාවය සහ එම භාණ්ඩ අතර සබඳතාවය වන්නේ,

(1) - 0.6 සහ ප්‍රතිබද්ධ භාණ්ඩ වේ.
(2) -2 සහ ප්‍රතිබද්ධ භාණ්ඩ වේ.
(3) - 2.5 සහ නම්‍ය භාණ්ඩ වේ.
(4) 0.6 සහ ආදේශක භාණ්ඩ වේ.
(5) 2 සහ ආදේශක භාණ්ඩ වේ.

8. කල්පිත භාණ්ඩයක වෙළඳපොළ සැපයුම් සමීකරණය වන්නේ, QS = -120 + 6 P වේ. මෙම භාණ්ඩය සම්බන්ධයෙන් කුමන ප්‍රකාශය නිවැරදි වන්නේ ද?

(1) මෙම භාණ්ඩයේ මිල වැඩිවන විට ඉල්ලුම් ප්‍රමාණය අඩුවේ.
(2) සැපයුම් වක්‍රයේ මිල අක්ෂය මත අන්ත: කණ්ඩය සෘණ අගයකි.
(3) සැපයුම් වක්‍රය දිගේ ඉහළට ගමන් කරන විට මිල සැපයුම් නම්‍යතාවය පහළ බසින අතර 1ට වැඩිවේ.
(4) රු.20 ට වැඩි සෑම මිලකදීම මිල සැපයුම් නම්‍යතාව 1 ට වඩා අඩුවේ.
(5) මෙම භාණ්ඩය කෘෂිකාර්මික හෝ ගොවිපළවල නිපදවන භාණ්ඩයකි.

9. යම් කිසි භාණ්ඩයක සමතුලිත මිල රු. 5/= ක් සහ සමතුලිත ප්‍රමාණය ඒකක 18 ක් වන විට සමතුලිතයේදී නිෂ්පාදන අතිරික්තය 52.50 සහ පාරිභෝගික අතිරික්තය රු. 13.50 ක් වේ. මෙම භාණ්ඩය සඳහා සැපයුම් නම්‍යතාවය අනම්‍ය වන්නේ නම්, පහත කුමන ඉල්ලුම් සහ සැපයුම් සමීකරණ යුගලය නිවැරදි වන්නේද?

(1) Qd = 78 – 6P
Qs = 3 + 25P
(2) Qd = 78 – 12p
Qs = 3+3P
(3) Qd = 72 – 9p
Qs = 3 + 3p
(4) Qd = 78 – 12 p
Qs = -3+3p
(5) Qd = 81 – 9p
Qs= -9+3P

10. කල්පිත භාණ්ඩයක සැපයුම වැඩිවීම නිසා, වෙළඳපළෙහි සමතුලිත ප්‍රමාණය වැඩි විය. නමුත් නිෂ්පාදකයාගේ අයභාරය අඩු විය. මෙම භාණ්ඩය සඳහා ඉල්ලුම් නම්‍යතාවය,

(1) අනම්‍ය වේ.
(2) ඒකීය නම්‍ය වේ.
(3) පූර්ණ නම්‍ය වේ.
(4) නම්‍ය වේ.
(5) පූර්ණ අනම්‍ය වේ.

11. ඉහළම නිෂ්පාදන අතිරික්තයක් දැකිය හැක්කේ, පහතට බෑවුම්වන සාමාන්‍ය ඉල්ලුම් වක්‍රයක් සමඟ පහත කුමන සැපයුම් වක්‍රය සංයෝග වූ විට ද?

(1) පූර්ණ නම්‍ය සැපයුම් වක්‍රයක්
(2) සාපේක්ෂ නම්‍ය සැපයුම් වක්‍රයක්
(3) ඒකීය නම්‍ය සැපයුම් වක්‍රයක්
(4) සාපේක්ෂ අනම්‍ය සැපයුම් වක්‍රයක්
(5) පූර්ණ අනම්‍ය සැපයුම් වක්‍රයක්.

12. රජය ඉන්ධනය වෙළඳ පොළෙහි ඉල්ලුම පාලනය කිරීම සඳහා QR ක්‍රමය හඳුන්වා දෙන ලදී. එහි ප්‍රතිඵලයක් නොවන්නේ,

(1) අධි ඉල්ලුමක් පැවතීමයි.
(2) කළු කඩ වෙළෙඳ පොලක් ඇතිවීමයි.
(3) පෝලිම් බිහිවීමයි.
(4) සමාජ සුභසාධනය ඉහළයාමයි.
(5) පරිපාලන වියදම් ඉහළ යාම.


iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers • Study Resources

13. රජය විසින් රාජ්‍ය ආදායම ඉහළ දැමීමත් ආර්ථික සුභ සාධනය උපරිම කිරීමත් අරමුණු කරගෙන වක්‍ර බද්දක් පනවන ලදී. මෙම අරමුණු දෙකම සපුරා ගැනීමට හැකිවන වෙළඳ පොළ තත්ත්වය වන්නේ,

(1) පූර්ණය නම්‍ය ඉල්ලුමක් සහ නම්‍ය සැපයුමක් පැවතීමයි.
(2) පූර්ණ අනම්‍ය ඉල්ලුමක් සහ නම්‍ය සැපයුමක් පැවතීමයි.
(3) ඒකීය නම්‍ය ඉල්ලුමක් සහ ඒකීය නම්‍ය සැපයුමක් පැවතීමයි.
(4) නම්‍ය ඉල්ලුමක් සහ නම්‍ය සැපයුමක් පැවතීමයි.
(5) අනම්‍ය ඉල්ලුමක් සහා අනම්‍ය සැපයුමක් පැවතීමයි.

14. තරගකාරී වෙළඳපළක අලෙවිවන කල්පිත භාණ්ඩයක් සඳහා ඉල්ලුම් හා සැපයුම් සමීකරණ පහත පරිදි වේ.

Qd = 240 – 12P　　　　Qs = 96 ඒකක.

රජය වෙළඳපළ මිල රු. 4 කින් අඩු කිරීම සඳහා මෙම වෙළඳපළට මැදිහත් වන්නේ නම් පහත කුමන ප්‍රකාශය නිවැරදි නොවන්නේද?

(1) නිෂ්පාදන අතිරික්තය රු. 384 කින් අඩුවේ.
(2) ආර්ථික සුභසාධනය අඩුවේ.
(3) පාරිභෝගික අතිරික්තය රු. 384 කින් ඉහළ යාම.
(4) රජය ඒකක 48 ක් ආනයනය කළ යුතුයි.
(5) ඒකක 48කින් අධි ඉල්ලුමක් හට ගැනීම.

15. කෙටි කාලීන නිෂ්පාදන ක්‍රියාවලියක "හීනවන ආන්තික ඵලදා නීතිය" ක්‍රියාත්මක වීමට පටන් ගන්නේ,

(1) මුළු නිෂ්පාදිතය (TP)අඩුවීමට පටන් ගන්නා විට.
(2) ආන්තික නිෂ්පාදිතය (MP) සෘණ අගයක් ගන්නා විට.
(3) ආන්තික නිෂ්පාදිතය (MP)දන අගයකින් පවතිමින් අඩුවීමට පටන් ගන්නා විට
(4) සාමාන්‍ය නිෂ්පාදිතය (AP) එහි උපරිමයට පැමිණෙන විට.
(5) ආන්තික නිෂ්පාදනය(MP) ශූන්‍ය වන විට.

16. කෙටි කාලීනව ආන්තික පිරිවැය (MC) සාමාන්‍ය මුළු පිරිවැයට(ATC) වඩා අඩු වන විට සිදුවිය යුත්තේ කුමක්ද ?

(1) සාමාන්‍ය මුළු පිරිවැය අඩුවන වේගයකින් ඉහළ යා යුතුය.
(2) සාමාන්‍ය මුළු පිරිවැය අනිවාර්යයෙන්ම පහළ යා යුතුය.
(3) සාමාන්‍ය මුළුපිරිවැය ස්ථාවරව පැවතිය යුතුය.
(4) සාමාන්‍ය මුළු පිරිවැය ඉහළ යා යුතුය.
(5) සාමාන්‍ය මුළු පිරිවැය එහි අවම මට්ටමේ තිබිය යුතුය.

17. ආයතනයක් වතුර බෝතල් 200 ක් නිෂ්පාදනය කරයි. 200 වන වතුර බෝතලයේ ආන්තික පිරිවැය (MC) රු.50කි. 200 වන වතුර බෝතලය නිෂ්පාදනය කිරීමට පෙර සාමාන්‍ය මුළු පිරිවැය (ATC) රු. 48 කි. 200 වන වතුර බෝතලය නිෂ්පාදනය කිරීමේ දී නව සාමාන්‍ය මුළු පිරිවැය (ATC) කොපමණද?

(1) රු. 48.10
(2) රු. 48.25
(3) රු. 48.50
(4) රු. 48.15
(5) රු. 48.01

18. කතිපයාධිකාරී වෙළඳ පොළක ආයතන අන්‍යෝන්‍ය වශයෙන් රඳා පවතින්නේ මන්ද යත්,

(1) එක් එක් ආයතනයේ ක්‍රියාමාර්ග වෙළඳපොළ මිලට සහ තරඟකරුවන්ගේ ලාභයට බලපාන බැවිනි.
(2) ආයතන සමජාතීය නිෂ්පාදන නිපදවන අතර ප්‍රතිවාදීන් නොසළකා හරින බැවිනි.
(3) පූර්ණ නම්‍ය ඉල්ලුමකට මුහුණ දෙන බැවිනි.
(4) මිල සැම විටම ආන්තික පිරිවැය මගින් තීරණය වන බැවිනි.
(5) ආයතන කිසිවිටෙකත් එකිනෙකා සමග තරග නොකරන බැවිනි.

19. වියදම් ප්‍රවේශය ඔස්සේ දළ දේශීය නිෂ්පාදිතය ගණනය කිරීමේදී ඇතුළත් කෙරෙන අයිතමය වන්නේ,

(1) අස්වැසුම වැනි සංක්‍රාම ගෙවීම්
(2) නිෂ්පාදනයේදී යොදාගත් අතර මැදි යෙදවුම්
(3) යටිතල පහසුකම් සඳහා රජය විසින් දරන වියදම්
(4) පාවිච්චි කළ මෝටර් රථ අලෙවිය
(5) ශ්‍රී ලාංකිකයන් විසින් විදේශ ගතව ලබන අදායම

www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers · Model Answers · Study Resources
iexamhub

20. ශ්‍රී ලංකාවේ දළ දේශීය නිෂ්පාදිතය පහත කුමන කරුණක් මගින් වර්ධනය කරයිද?

(1) විරැකියාව සඳහා සහනාධාර ඉහළ යාම.
(2) පාරිභෝගික භාණ්ඩ ආනයනය
(3) තේ අපනයනය ඉහළ යාම
(4) කොටස් වෙළඳපොලේ කොටස් විකිණීම
(5) විශ්‍රාමිකයන්ට ගෙවන විශ්‍රාම වැටුප් ඉහළ යාම.

21. එක්තරා ආර්ථිකයක මුලු සම්පත් රු. 72 000 කි. ආයෝජනය රු. 48 000 සහ සාධක නොවන අපනයන වටිනාකම රු. 7 500ක් වන්නේ නම්, මුළු පරිභෝජන වටිනාකම වන්නේ,

(1) රු. 55 000
(2) රු. 27 000
(3) රු. 16 500
(4) රු. 24 000
(5) රු. 14 000

22. 2024 වර්ෂයේ දළ දේශීය නිෂ්පාදිතයට සේවා අංශයේ දායකත්වය වන්නේ,

(1) 60.7 %
(2) 59.2 %
(3) 55.9 %
(4) 62.5 %
(5) 51.5 %

23. රජයේ මැදිහත්වීම සහිත ආවෘත ආර්ථිකයකට අදාළ දත්ත පහත දක්වා ඇත.

ඉතුරුම් ශ්‍රිතය S = - 500+0.2 Yd　　බදු T = රු. 100

ආයෝජන I = රු.මි. 100　　රාජ්‍ය වියදම G = රු. මි. 250

මෙම ආර්ථිකයේ සමතුලිත නිමැවුම හා එම නිමැවුමේදී පරිභෝජන වියදම වන්නේ,

(1) Y = 3 850 , C = 3 500
(2) Y = 1 800 , C = 1 350
(3) Y = 3 100 , C = 2 750
(4) Y = 6 600 , C = 1 300
(5) Y = 2 200 , C = 1 650

24. සාර්ව ආර්ථිකයක යම් දෙන ලද අවසථාවක පාරිභෝජන ශ්‍රිතයේ ඉහළට සමාන්තර විතැන්වීමක් දැකිය හැක්කේ පහත කිනම් අවස්ථාවේ දී ද?

(1) රජය විසින් අයකළ ස්වාධීන බදු අඩු කිරීම.
(2) ආන්තික ඉතුරුම් නැඹියාව ඉහළ යාම.
(3) කුටුම්භ වෙත ලබා දෙන සංක්‍රාම වල පහළ යාම.
(4) ආදායම් බදු ප්‍රතිශතයේ ඉහළ යාම.
(5) ආන්තික පරිභෝජන නැඹියාව ඉහළ යාම.

25. යම් ආර්ථිකයක ආන්තික පරිභෝජන නැඹියාව 0.8 වේ. රජය විසින් මෙම ආර්ථිකයට රු.මි. 50 ක ස්වාධීන බද්ධක් පැනවූ විට බදු ගුණකය හා ජාතික නිමැවුමේ වෙනස (ΔY) නිවැරදිව දැක්වෙන වරණය වන්නේ,

(1) බදු ගුණකය = - 4 , ΔY = රු.මි. – 200
(2) බදු ගුණකය = - 5 , ΔY = රු.මි. - 250
(3) බදු ගුණකය = - 4 , ΔY = රු.මි. – 250
(4) බදු ගුණකය = - 5 , ΔY = රු.මි. - 200
(5) බදු ගුණකය = - 3 , ΔY = රු.මි. – 150

26. ඉහළ උද්දමනයක් සහිත ආර්ථිකයක මහජනයා ඉතිරි කිරීමේ අරමුණ සඳහා විදේශ මුදල් භාවිතය ආරම්භ කලද එදිනෙදා ගනුදෙනු සඳහා දේශීය මුදල් භාවිත කරයි. පහත සඳහන් මුදලේ කාර්යයන් අතුරින් මූලික වශයෙන් දුර්වල වන්නේ,

(1) හුවමාරු මාධ්‍යයක් වීම.
(2) වටිනාකමේ සන්නිධියක් ලෙස ක්‍රියා කිරීම.
(3) ගිණුම් ඒකකයක් වීම.
(4) විලම්භිත ගෙවීම් ක්‍රමයක් වීම.
(5) හුවමාරු මාධ්‍යයක් හා ගිණුම් ඒකකයක් ලෙස ක්‍රියාකිරීම යන දෙකම.


www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources
iexamhub

27. මෑත කාලීන මූල්‍ය දත්තවලට අනුව ශ්‍රී ලංකාවේ පුළුල් මුදල් සැපයුම (M2) වර්ධනය මගින් පෙන්නුම් කරන වඩාත් හොඳම ආර්ථික ඇඟවීම වනුයේ, පහත සඳහන් කවරක්ද ?

(1) අධික ද්‍රවශීලතාවය හේතුවෙන් ආර්ථිකය උද්ධමනකාරී තත්වයකට ලක්වීමට ඉඩ ඇත.
(2) උද්දමන පීඩනය පාලනය වී තිබීමට හෝ ස්ථාවරව තිබීමට ඉඩ ඇත.
(3) අපනයන දිරිගැන්වීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව දැඩි ලෙස මුදල් අච්චු ගසමින් සිටියි.
(4) විනිමය අනුපාතය වේගයෙන් වැඩි දියුණු වේ.
(5) මෙහි ප්‍රතිඵලයක් ලෙස මූල්‍ය හිඟය ස්වයංක්‍රීයව පුළුල් විය යුතුය.

28. යම් ආර්ථිකයක් මූර්ත දළ දේශීය නිෂ්පාදිතය රු.බි. 5000 කි. පදනම් වර්ෂයේ මිල දර්ශකය 100 ක් වන අතර පවත්නා වර්ෂයේ මිල දර්ශකය 160කි. පටු මුදල් සැපයුම (M1) රු. 2000ක් වන්නේ නම්,මුදල් සංසරණ ප්‍රවේගය (V) ගණනය කළ විට

(1) 2.0 (2) 2.5 (3) 3.0 (4) 3.5 (5) 4.0

29. ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය 10% ක් වන බැංකු ක්‍රමයකට රු. 100 000 ක මුදල් තැන්පතුවක් පැමිණි විට බැංකු ක්‍රමය මගින් අධි සංචිත පවත්වා නොගන්නේ නම් සහ සියලු ණය ලබා ගන්නන් එම බැංකු ක්‍රමයේම තැන්පත් කරන්නේ නම් එම බැංකු ක්‍රමයට නිර්මාණය කළ හැකි උපරිම ණය ප්‍රමාණය වන්නේ,

(1) රු. 100 000 (2) රු. 900 000 (3) රු. 1 000 000
(4) රු. 810 000 (5) රු. 90 000

30. ආර්ථිකයක් තුළ පහත සඳහන් සිදුවීම් එකවර සිදු වේ.

A රජය බැංකු ණය මගින් මූල්‍යනය කරනු ලබන රජයේ ආයෝජන ඉහළ නංවයි.
B ජාත්‍යන්තර තෙල් මිල සීඝ්‍රයෙන් ඉහළ යයි.
C විරැකියාව ස්වාභාවික විරැකියා අනුපාතයට වඩා පහළ බසී.
D වෘත්තීය සමිති ඉහළ නාමික වැටුප් ලබා ගැනීමට සාකච්ඡා කරයි.

ඉල්ලුමෙන් ඇදුණු උද්දමනය සහ පිරිවැයෙන් තල්ලු වුන උද්දමනය සඳහා මූලික හේතු නිවැරදිව හඳුනා ගන්නා සංයෝගය කුමක්ද?

| ඉල්ලුමෙන් ඇදුණු උද්දමනය | පිරිවැයෙන් තල්ලුවුන |
|---|---|
| 1. A සහ B | C සහ D |
| 2. A සහ C | B සහ D |
| 3. C පමණි | B පමණි |
| 4. A, B සහ C | D පමණි |
| 5. A, B, C, D | - |

31. අවගුණ භාණ්ඩ සම්බන්ධයෙන් වෙළඳ පොළ අසමත්වීම වඩාත් හොඳින් පැහැදිලි කරන්නේ පහත සඳහන් කවරක් මගින්ද?

(1) ආන්තික සමාජ ප්‍රතිලාභ, ආන්තික පෞද්ගලික ප්‍රතිලාභයට වඩා වැඩිය. ( MSB > MPB )
(2) ආන්තික පෞද්ගලික පිරිවැය, ආන්තික සමාජ පිරිවැයට වඩා වැඩිය. ( MPC > MSC )
(3) ආන්තික සමාජ පිරිවැය, ආන්තික පෞද්ගලික පිරිවැයට වඩා වැඩිය. ( MSC > MPC )
(4) ආන්තික පෞද්ගලික ප්‍රතිලාභ, ආන්තික සමාජ ප්‍රතිලාභයට වඩා වැඩිය. ( MPB > MSB )
(5) ආන්තික සමාජ ප්‍රතිලාභ, ආන්තික පෞද්ගලික ප්‍රතිලාභ වලට සමාන වේ. ( MSB = MPB )

32. රජයෙන් නව බදු ප්‍රතිපත්තියක් ඇගයීමට ලක් කරමින් සිටී. යෝජිත බදු එකතු කිරීම පහසු මෙන් අඩු පිරිවැයක් සහිත වේ. සම්පත් වෙන් කිරීමේදී සිදුවන විකෘතිතාවය අවම කරයි සහ බදු ගෙවන්නාගේ ගෙවීමේ හැකියාව අනුව පනවනු ලැබේ. මෙම යෝජනාව මගින් තෘප්තිමත් වන්නේ යහපත් බද්දක කුමන ලක්ෂණයක්ද ?

(1) සාධාරණත්වය, නිශ්චිතභාවය සහ පහසුව.
(2) පිරිමැසුම් බව, මධ්‍යස්ථභාවය සහ සාධාරණත්වය.
(3) නිශ්චිතභාවය, සාධාරණත්වය සහ පහසුව.
(4) පිරිමැසුම් බව, නිශ්චිතභාවය සහ මධ්‍යස්ථ බව.
(5) නිශ්චිතබව


iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

33. රජයේ සමහර වියදම් ප්‍රාග්ධන වියදම් ලෙස හැඳින්වෙන්නේ, ඒවා

(1) රජයේ එදිනෙදා පරිපාලන කටයුතු ඉලක්ක කර ඇති නිසාය.
(2) දිගු කාලයක් පුරා ප්‍රතිලාභ ලබා දෙන වත්කම් නිර්මාණය කිරීමට හේතුවන නිසාය.
(3) එකම මූල්‍ය වර්ෂය තුළ සම්පූර්ණයෙන්ම පරිභෝජනය කරන නිසාය.
(4) මූලික වශයෙන් වැටුප් සහ විශ්‍රාම වැටුප් ගෙවීමට යොදා ගන්නා නිසාය.
(5) කිසිදු ප්‍රතිලාභයක් නොමැතිව සංක්‍රාම ගෙවීමක් නිසාය.

34. රජය විසින් බදු පනවනු ලබන විට, ආර්ථිකය තුළ සම්පත් වැරදි ලෙස වෙන් කිරීම හේතුවෙන් ආර්ථික අකාර්යක්ෂමතාවක් ඇති වේ. මෙය හඳුන්වනු ලබන්නේ,

(1) ආර්ථික බදු ආපාතය. (2) බදුකරණයේ මධ්‍යස්ථ බව.
(3) අධි බදු බර. (4) බදු අනුකූලතාවයේ හිඟකම.
(5) බද්ද පසුපසට විතැන්වීම.

35. ඉතා ඉහළ තත්වයක පැවති රාජ්‍ය මූල්‍ය හිඟය ක්‍රමයෙන් අඩුවන තත්වයක් පසුගිය වර්ෂවල ශ්‍රී ලංකාවේ දක්නට ලැබිණි. මෙහි ප්‍රතිවිපාකයක් නොවන්නේ,

(1) පොළී අනුපාතය අඩු වීම. (2) පෞද්ගලික ආයෝජන අඩු වීම.
(3) රාජ්‍ය ණය ගැනීම වැඩි වීම. (4) ප්‍රාථමික ගිනුමේ ශේෂය වැඩි දියුණු වීම.
(5) රාජ්‍ය ණය අඩු වීම.

36. A සහ B රටවල් යෙදවුම් ඒකකයකින් නිපදවන ආහාර හා රෙදි ප්‍රමාණයන් පහත නිෂ්පාදන හැකියා මායිම මගින් දැක්වේ.




මෙම රටවල් දෙක අතර වඩා වාසිදායක හුවමාරුවක් සිදුවී පැවතිය යුතු තත්ත්වය වන්නේ,

(1) 1 C = 0.6 F (2) 1 C = 0.5 F
(3) 1 C = 0.7 F (4) 1 C = 1.5 F
(5) 1 C = 0.3 F

37. යම් භාණ්ඩයක් ආනයනය කිරීමට රු. 600 ක් වැය වේ. මේ සඳහා ආනයනික යෙදවුම් වල අගය රු. 300 ක් වන අතර නිමි භාණ්ඩ සහ ආනයනික යෙදවුම් යන දෙකම මත පනවා ඇති තීරු බදු අනුපාතිකය 10% නම් සඵල ආරක්ෂණ අනුපාතිකය කොපමණද?

(1) 5 % (2) 10 % (3) 20 % (4) 25 % (5) 50 %

38. පහත සඳහන් ආර්ථික ඒකාබද්ධතා අතරින්, සාමාජික රටවල් අතර නිදහස් වෙළඳාමක් පවතින මෙන්ම පොදු තීරු බදු ක්‍රමයක් පවතිනුයේ කවරකද ?

(1) වරණීය වෙළඳ ගිවිසුම (PTA) (2) නිදහස් වෙළඳ කලාප (FTA)
(3) තීරු බදු සංගමය (CU) (4) පොදු වෙළඳ පොළ (CM)
(5) ආර්ථික සංගමය (EU)

39. පහත සඳහන් දෑ අතුරින් රටක භාණ්ඩ වෙළඳ අනුපාතය වැඩි දියුණු වීමට හේතු වන්නේ,

(1) උද්ධමනය.
(2) ශ්‍රම ඵලදායිතාවයේ දියුණුව.
(3) ආනයනික භාණ්ඩවල මිල ඉහළ යාම.
(4) දේශීය මුදලේ අගය ප්‍රතිප්‍රමාණය වීම.
(5) සැපයුම් දාම බිඳ වැටීම හේතුවෙන් අමු ද්‍රව්‍ය මිල ඉහළ යාම.


iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

40. රටක ගෙවුම් ශේෂ දත්ත කිහිපයක් පහත දැක්වේ. (සියලු දත්ත ඇ.ඩො. බිලියන)

ජංගම ගිණුමේ ශේෂය - 200

ප්‍රාග්ධන ගිණුමේ ශේෂය - 75

පහත පිළිතුරු අතරින් වැරදීම් හා අත් හැරීම් සහ මූල්‍ය ගිනුමේ ශේෂය පිළිබඳ නිවැරදි වන්නේ,

| | වරදීම් හා අත්හැරීම් | මූල්‍ය ගිණුමේ ශේෂය |
|---|---|---|
| (1) | - 125 | 125 |
| (2) | - 75 | - 200 |
| (3) | - 25 | - 100 |
| (4) | - 25 | + 150 |
| (5) | 40 | + 160 |

41. ඇමරිකානු ඩොලැයක අගය රු. 280 කි. ශ්‍රී ලංකා රුපියල 30% කින් අවප්‍රමාණය වේ නම්, අවප්‍රමාණයෙන් පසු ඇමරිකානු ඩොලරයක අගය කොපමණද ?

(1) රු. 364 (2) රු. 2015 (3) රු. 400
(4) රු. 410 (5) රු. 150

42. ශ්‍රී ලංකා මහ බැංකුවේ දත්ත වලට අනුව, 2025 වර්ෂය අවසානයේ ශ්‍රී ලංකාවේ දළ නිල සංචිත ප්‍රමාණය කොපමණද?

(1) ඇමරිකානු ඩොලර් බිලියන 7.8 (2) ඇමරිකානු ඩොලර් බිලියන 6.8
(3) ඇමරිකානු ඩොලර් බිලියන 6·1 (4) ඇමරිකානු ඩොලර් බිලියන 7.3
(5) ඇමරිකානු ඩොලර් බිලියන 5.2

43. සර්ව සහභාගී ආර්ථික සංවර්ධනයක් සඳහා ශ්‍රී ලංකාව වැනි සංවර්ධනය වෙමින් පවතින රටකට ගත හැකි වඩාත් කාර්යක්ෂම උපාය මාර්ගය වන්නේ,

(1) අපනයනාභිමුඛ කාර්මික සංවර්ධනය සඳහා මූලිකත්වය ගැනීම.
(2) මානව ප්‍රාග්ධනය, ග්‍රාමීය සංවර්ධනය හා කුඩා ව්‍යවසායකයන් සඳහා ආයෝජනය.
(3) නාගරික සුබෝපභෝගී පරිභෝජනය වැඩි කිරීම.
(4) අධ්‍යාපනය හා සෞඛ්‍යය සඳහා වන රජයේ වියදම් අඩු කිරීම.
(5) කෙටි කාලීන ව්‍යාපෘති සඳහා ප්‍රධාන වශයෙන් විදේශ ණය ගැනීම් මත රඳා පැවතීම.

44. සංවර්ධනය මිනුම් කිරීම සඳහා භාවිතා වන ආංශික දර්ශකයක් වන්නේ,

(1) ඒක පුද්ගල ආදායම. (2) මානව සංවර්ධන දර්ශකය.
(3) සතුටු දර්ශකය. (4) සෞභාග්‍යතා දර්ශකය.
(5) බහුමාන දරිද්‍රතා දර්ශකය.

45. 2026 වර්ෂයේ ලෝක සතුටු දර්ශකය අනුව ශ්‍රී ලංකාවේ ශ්‍රේණිගත කිරීම වන්නේ,

(1) 138 (2) 128 (3) 134 (4) 183 (5) 120

46. ආර්ථිකයක ගිනි සංගුණකය වැඩි කරන්නේ පහත සඳහන් ඒවායින් කුමක්ද?

(1) ධනවත් පංතියේ ආදායම දුගී ජනතාව අතර නැවත බෙදා හැරීම.
(2) සමාජ සුභ සාධන සංක්‍රාම ඉහළ නැංවීම.
(3) අඩු ආදායම්ලාභී කුටුම්භ අංශයට වඩා ඉහළ ආදායම්ලාභී කුටුම්භ අංශයේ වේගවත් ආර්ථික වර්ධනය.
(4) නොමිලේ අධ්‍යාපනය සහ සෞඛ්‍ය සේවා සඳහා විශ්වීය ප්‍රවේශය.
(5) අනුක්‍රමික බදු ක්‍රමයක් නිර්මාණය කිරීම.


www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers · Model Answers · Study Resources
iexamhub

47. ජනගහණ දරිද්‍රතා දර්ශකය සහ ජාතික දරිද්‍රතා ඉම අතර වෙනස සඳහන් වරණය වන්නේ,

(1) ජනගහන දරිද්‍රතා දර්ශකය මගින් ආදායම් සීමාව මනිනු ලබන අතර ජාතික දරිද්‍රතා ඉම මගින් එම සීමාවට පහළ ජන කොටස නිරූපනය කෙරේ.

(2) ජනගහන දරිද්‍රතා දර්ශකය මගින් දරිද්‍රතා ඉමට පහළින් සිටින ජනගහනයේ අනුපාතය මනින අතර ජාතික දරිද්‍රතා ඉම මගින් මූලික අවශ්‍යතා සපුරාලීම සඳහා අවශ්‍ය අවම ආදායම නිර්වචනය කෙරේ.

(3) ජනගහන දරිද්‍රතා දර්ශකය සහ දරිද්‍රතා ඉම යන ආකාර දෙකම ආදායම් අසමානතාවය මන්නු ලබයි.

(4) ජාතික දරුද්‍රතා ඉම, ජනගහන දරිද්‍රතා දර්ශකය සමඟ වෙනස් වන අතර, ජනගහන දරිද්‍රතා දර්ශකය ස්ථාවරව පවතී.

(5) ජනගහන දරිද්‍රතා දර්ශකය තුළ ආදායම් නොවන සාධක අන්තර්ගත වන අතර ජාතික දරුද්‍රතා ඉම තුළ ආදායම පමණක් අන්තර්ගත වේ.

48. ශ්‍රී ලංකා රජය විසින් 2026 වර්ෂයේ ආරම්භ කරන ලද "ප්‍රජාශක්ති" වැඩ සටහනේ ප්‍රධාන අරමුණ වන්නේ,

(1) ග්‍රාමීය සහ වතු වගාවන් බල ගන්වන සාදාරණ ආර්ථික ව්‍යාපෘතියක් සහතික කරන සහ සමාජ ආරක්ෂාව ශක්තිමක් කරන ප්‍රජා මූලික ජනතා කේන්ද්‍රීය ප්‍රවේශයන් හරහා දරිද්‍රතාව තුරන් කිරීම.

(2) රටපුරා රජයේ සියලුම පාසල්වල ඩිජිටල් තාක්ෂණය ප්‍රවර්ධනය කිරීම.

(3) ග්‍රාමීය දරිද්‍රතාව තුරන් කිරීම සහ ආරථික ප්‍රතිලාභ සාදාරණ ලෙස බෙදා හැරීම සඳහා රාජ්‍ය යන්ත්‍රණයක් ඒකාබද්ධ කිරීම සහ ප්‍රජාවන් බල ගැන්වීම.

(4) ආර්ථික වර්ධනය සඳහා රාජ්‍ය ව්‍යවසායන් පෞද්ගලීකරණය කිරීම සහ ආර්ථික වර්ධනයේ ක්‍රියාවලියට සහායවීම සඳහා නාගරික දුප්පත් අංශයට සහායවීම.

(5) වඩාත්ම සුදුසු දුප්පත්ම සහ අවධානමට ලක්විය හැකි පවුල් සඳහා ඉලක්කගත විනිවිද පෙනෙන සහ තාවකාලික මූලිකාධාර සැපයීම.

49. නැවත වතාවක් ආර්ථික පරිහානියකට ලක් නොවීම සඳහා ශ්‍රී ලංකාව විසින් පහත කුමන පියවර අනුගමනය නොකල යුතුද?

(1) අය - වැය හිඟය අඩු කිරීම මගින් රාජ්‍ය මූල්‍ය විනය ශක්තිමත් කිරීම.

(2) අපනයන විවිධාංගීකරණය ධෛර්යමත් කිරීම සහ විදේශ විනිමය ඉපයීම් වැඩි කිරීම.

(3) දිගු කාලීනව කෘතිම පාලිත විනිමය අනුපාතයක් පවත්වාගෙන යාම.

(4) කාර්යක්ෂම බදු පරිපාලනයක් තුලින් රාජ්‍ය බදු ආදායම ඉහළ නැංවීම.

(5) සෘජු විදේශ ආයෝජණ ඉහළ නැංවීම.

50. වර්තමාන ආර්ථික තත්වය හමුවේ ශ්‍රී ලංකාවේ ආද්‍රයම් බෙදී යාමේ විෂමතාවය සහ දරිද්‍රතාවය අඩු කිරීම සඳහා අවම ද්‍රයකත්වයක් සපයන ප්‍රතිපත්තිමය යෝජනා වන්නේ,

(1) දරිද්‍රතා අවදානමට ලක්විය හැකි කුටුම්භ දක්වා අස්වැසුම සුභ සාධන වැඩ සටහන ව්‍යාප්ත කිරීම.

(2) ප්‍රාදේශීය අසමතුලිතතාවය අඩු කිරීම සඳහා ඩිජිටල් සබඳතාවල සහ ග්‍රාමීය යටිතල පහසුකම් වැඩි දියුණු කිරීමට ආයෝජනය කිරීම.

(3) ආදායම් මට්ටම නොසලකා ඉන්ධන හා විදුලිබලය මත සියලු දෙනාට සාධාරණ සහනාධාරයක් ලබා දීම.

(4) අඩු ආදායම් ලාභී කණ්ඩායම් සඳහා ගුණත්වයෙන් යුතු අධ්‍යාපනයට හා වෘත්තීය පුහුණු වැඩසටහන්වලට ප්‍රවේශ වැඩි කිරීම.

(5) කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරවල සංවර්ධනය හා ක්ෂුද්‍ර මූල්‍ය වැඩසටහන් හරහා සර්ව සහභාගීත්ව සංවර්ධනය ධෛර්මත් කිරීම.


www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources
iexamhub

සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

තෙවන වාර පරීක්ෂණය
மூன்றாம் கால சோதனை - 2026
Third Term Test

| ශ්‍රේණිය / தரம் / Grade | 13 | විෂයය / பாடம் / Subject | ආර්ථික විද්‍යාව | පත්‍රය / வினாத்தாள் / Paper | II | පැය / மணித்தியாலம் / Hours | 03 |
|---|---|---|---|---|---|---|---|

**උපදෙස් :**
* "අ" කොටසින් අවම ප්‍රශ්න 2 ක්ද "ආ" කොටසින් අවම ප්‍රශ්න 2 ක්ද තෝරා, සම්පූර්ණ ප්‍රශ්න 05 කට පිළිතුරු සපයන්න.

## " අ " කොටස

(මෙම කොටසින් අවම වශයෙන් ප්‍රශ්න 2ක් තෝර ගන්න)

01. කුඩා ඉඩමක හිමිකරුවන ගොවියෙකු සතුව පොල් ගස් කිහිපයක් ඇති අතර ඔහු පොල්තෙල් නිෂ්පාදනය කිරීමට සැලසුම් කරයි. ඒ සඳහා ඔහු කම්කරුවන් දෙදෙනෙකු බඳවා ගනී. කෙසේ වෙතත්, පොල් ප්‍රමාණය සහ සේවකයින් සංඛ්‍යාව සීමිතය. පොල් වෙළඳපොලේ විකිණිය යුතුද නැතහොත් ඒවායින් පොල්තෙල් නිෂ්පාදනය කළ යුතුද යන්න ගොවියා තීරණය කළ යුතුය. අවසානයේ ඔහු පොල් විකිණීම වෙනුවට පොල්තෙල් නිෂ්පාදනය කිරීමට තීරණය කරයි.

(i) ඉහත සිදුවීම ඇසුරින් හිඟකම, තේරීම, ප්‍රතිෂ්ඨාපනය කළ හැකි සම්පත් සහ අවස්ථික පිරිවැය යන සංකල්ප පැහැදිලි කරන්න. (ලකුණු 04)

(ii) "යම් භාණ්ඩයක් නිෂ්පාදනය වැඩි කරන විට එහි ආවස්ථික පිරිවැය ඉහළ යයි." නිෂ්පාදන හැකියා මායිම් වක්‍රය සහ එම වක්‍රයේ හැඩයට බලපාන හේතු ඇසුරින් මෙම ප්‍රකාශය පැහැදිලි කරන්න. (ලකුණු 4යි)

(iii) නිෂ්පාදන හැකියා මායිම් වක්‍ර භාවිතයෙන් පහත සිදුවීම් පැහැදිලි කරන්න.
(අ) ශ්‍රී ලංකා ආර්ථිකයට "දිට්වා" සුළි කුණාටුවෙන් ඇතිවූ බලපෑම.
(ආ) මැදපෙරදිග යුද ගැටුම් ශ්‍රී ලංකාවට බලපාන ආකාරය.
(ඇ) ශ්‍රී ලංකාවේ තේ සඳහා පවතින ඉල්ලුම අඩුවීම.
(ඈ) කෘෂි කාර්මික අංශය සඳහා ඩ්‍රෝන තාක්ෂණය භාවිත කිරීම. (ලකුණු 4යි)

(iv) "වෙළඳපොළ ආර්ථික පද්ධතියක ගාමක බලවේගයක් වන්නේ ස්වාර්ථයයි" උදාහරණයක් සහිතව සාකච්ඡා කරන්න. (ලකුණු 02)

(v) විධාන ආර්ථික පද්ධතියක පවතින අවාසි මොනවාද ? (ලකුණු 02)

(vi) නූතන ආර්ථික පද්ධතිය තුළ සමාජ ප්‍රාග්ධනයේ කාර්ය භාරය කුමක්ද ? (ලකුණු 02)

2. (i) පෙට්‍රල්වල මිල වැඩි වුවද, ඒ සඳහා ඇති ඉල්ලුම අඩු නොවිණි. හේතුව පහදන්න. (ලකුණු 02)

(ii) පෙට්‍රල්වල මිල වෙනස්වන ප්‍රතිශතාත්මක වෙනසට සමානව හෝ ඊට වඩා වැඩියෙන්, ඒ සඳහා ඇති සැපයුම වෙනස් නොවීමට හේතු මොනවාද? (ලකුණු 04)

(iii) අධ්‍යාපනය සඳහා ඇති ඉල්ලුම වැඩි වුවද, එහි වෙළඳපොළ මිල පහත වැටී ඇත. මෙම වෙළඳපොළ තත්වය ප්‍රස්ථාරයක් ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 04)

(iv) දෙන ලද අවස්ථාවකදී , අනෙකුත් සාධක නොවෙනස්ව පවතින විට, y භාණ්ඩයේ ඉල්ලුම් ප්‍රමාණය හෝ ඉල්ලුම, Y භාණ්ඩයේ මිලෙහි (Py) හෝ පාරිභෝගික ආදායමෙහි (Y) හෝ X භාණ්ඩයේ මිලෙහි (Px) හෝ වෙනස් වීමට දක්වන ලද ප්‍රතිචාරය පහත පරිදි වේ.

| Px | Y | Py | D/Qdy |
|---|---|---|---|
| රු. | රු. "000" | රු. | "ඒකක" |
| 24 | 50 | 40 | 200 |
| 30 | 200 | 32 | 300 |

y භාණ්ඩයේ ලක්ෂණ තුනක් ලියා දක්වන්න (ලකුණු 3)


iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

(v) කල්පිත වෙළඳ පොළක අලෙවි වන කල්පිත භාණ්ඩයක් සම්බන්ධයෙන් පහත තොරතුරු සපයා ඇත.

මිල ඉල්ලුම් සමීකරණය = Pd = 12- 1/9 Q

අයි ඉල්ලුම් සමීකරණය = Ex • D = 120 – 12P

(අ) වෙළඳපොළ සමතුලිතය ගණනය කරන්න. (ලකුණු 2)

(ආ) සමතුලිතය ප්‍රස්ථාරිකව දක්වන්න. (ලකුණු 3)

(ඇ) සමතුලිතයේදී නිෂ්පාදන අතිරික්තය සහ පාරිභෝගිකයා ගෙවීමට කැමති වියදම ගණනය කරන්න. (ලකුණු 2)

3. (i) යම්කිසි භාණ්ඩයකට සැපයුම්කරු වෙත ඒකක බද්ධක් පැනවීමේදී, මිල සැපයුම් නම්‍යතාවය අනුව සමාජ සුභසාධනයට වන බලපෑම ප්‍රස්ථාර ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 4)

(ii) "රජය නැවතත් ඉන්ධන වෙළඳපොළ සඳහා QR ක්‍රමවේදය හඳුන්වා දෙන ලදී." මෙහි ආර්ථික ප්‍රතිවිපාක ප්‍රස්තාරයක් ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 4)

(iii) 'පවතින මැදපෙරදිග යුධ තත්වය නිසා, ආනයනික භාණ්ඩවල සහ ආනයනි අමුද්‍රව්‍ය භාවිතයෙන් නිපදවන භාණ්ඩවල මිල ගණන් වැඩිවුනි.' මෙම භාණ්ඩවල මිල උච්චාවචනයන් පාලනය කිරීම සඳහා ඔබගේ යෝජනා මොනවාද? (ලකුණු 2යි)

(iv) තරඟකාරී වෙළඳ පොළක අලවිවන භාණ්ඩයක් සම්බන්ධයෙන් පහත තොරතුරු ලබා දී ඇත:

* Qd = 27 - 3p (ඉල්ලුම් සමීකරණය)
* Qs = -5 + 5p (සැපයුම් සමීකරණය)

රජය විසින් රු. 1.60 ක ඒකක බද්දක් පනවන්නේ නම්, පහත දෑ ගණනය කරන්න.

(අ) සමතුලිතයට වන බදු බලපෑම. (ආ) නිෂ්පාදන අතිරික්තයට වන බලපෑම.

(ඇ) පාරිභෝගික අතිරික්තයට වන බලපෑම. (ඈ) ආර්ථික අතිරික්තයට වන බලපෑම.

(ඉ) අහිමි වූ ආර්ථික සුභසාධනය. (2 x 5 = ලකුණු 10යි)

4. (i) සචිනි 'රවිනි' සමාගමේ මෘදුකාංග ඉංජිනේරුවරියක ලෙස සේවය කරමින් රු. 80,000 ක මාසික වැටුපක් ලබයි. ඇය රැකියාවෙන් ඉල්ලා අස්වී, වාර්ෂිකව 10% ක පොලියක් ලැබෙන ඇයගේ රු. 500 000 ක ඉතුරුම් ප්‍රාග්ධනය ලෙස යොදාගෙන "බිනුරි" නමින් සපත්තු නිෂ්පාදන ආයතනයක් ආරම්භ කිරීමට තීරණය කරයි. ඇය රු. 30 000 බැගින් වූ මාසික වැටුප් සේවකයින් 4 දෙනෙකු යොදවා බඳවා ගනී. ඇයගේ සමාගමේ මාසික පිරිවැය පහත පරිදි වේ:

* අමුද්‍රව්‍ය රු. 100 000
* විදුලිය රු. 5 000
* ගොඩනැගිලි කුලිය රු. 20 000
* ප්‍රවාහනය: රු. 10,000

සචිනි රු. 5,000 බැගින් සපත්තු 100ක් විකිණීමට අපේක්ෂා කරන අතර අවම වශයෙන් රු. 80,000ක මාසික ලාභයක් බලාපොරොත්තු වේ.

පහත සඳහන් දෑ ගණනය කරන්න:

(අ) ඍජු පිරිවැය සහ වක්‍ර පිරිවැය. (ආ) ආර්ථික ලාභය සහ ගිණුම්කරණ ලාභය. (ලකුණු 4)

(ii) ආන්තික පිරිවැය )MC) සහ සාමාන්‍ය පිරිවැය )AC) වක්‍ර අතර පවතින සම්බන්ධතාවය පැහැදිලි කරන්නකෙටි . කාලීන නිෂ්පාදනයේදී මෙම වක්‍ර'U' හැඩයක් ගැනීමට හේතුව කුමක්ද? (ලකුණු 04)

(iii) පරිමාණානුකූල පිරිමැසුම් සහ පරිමාණානුකූල නොපිරිමැසුම් ඇති වීමට බලපාන හේතු මොනවාද? (ලකුණු 04)

(iv) පූර්ණ තරඟකාරී ආයතනයක් "මිල ගනුවකු" ලෙස ක්‍රියා කළ යුත්තේ ඇයි? පැහැදිලි කරන්න. (ලකුණු 02)

(v) ඒකාධිකාරී වෙළඳපොළ සහ ඒකාධිකාරී තරඟකාරී වෙළඳපොළ අතර වෙනස්කම් මොනවාද? (ලකුණු 02)

(vi) ආර්ථික බදු කුලිය සහ සංක්‍රාම ඉපයීම සාධක සැපයුම් නම්‍යතාවය මත රඳා පවතී සුදුසු රූප .සටහන් ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 04)

5. (i) මූලික ප්‍රවේශයන් තුන ඔස්සේ ජාතික ගිණුම් සැකසීමේ දී නිෂ්පාදිතයේ අගය සමාන වන්නේ ඇයි? (ලකුණු 4)

(ii) කල්පිත ආර්ථිකයක් සඳහා වන පහත සඳහන් දත්ත උපයෝගී කර ගනිමින් දළ දේශීය නිෂ්පාදිතය ගණනය කරන්න. (රු. මිලියන)

| | | | |
|---|---|---|---|
| * පුද්ගලික පරිභෝජන වියදම (C) | = 2400 | * තොග වෙනස් වීම | = 560 |
| * දළ දේශීය ස්ථාවර ප්‍රාග්ධන සම්පාදනය | = 1200 | * වටිනාකම් වෙනස්වීම් මත ආයෝජන | = 450 |
| * රජයේ මිලදී ගැනීම් (G) | = 2200 | * අපනයන (X) | = 400 |
| * ආනයන (M) | = 600 | * ශුද්ධ වක්‍ර බදු | =150 |

(ලකුණු 4)



iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

(iii) "දළ දේශීය නිෂ්පාදිතය සහ දළ දේශීය වියදම යනු එකම සංකල්පයකි". විමසන්න. (ලකුණු 4)

(iv) රජයේ මැදිහත් වීම සහිත ආවෘත ආර්ථිකයක පහත සඳහන් දත්ත ඔබට සපයා ඇත.

ඉතුරුම් ශ්‍රිතය S = -2000 + 0.2Yd   ආයෝජනය I = 400
රජයේ මිලදී ගැනීම් G = 160   ස්වාධීන බදු T = 100

(අ) පරිභෝජන ශ්‍රිතය ව්‍යුත්පන්න කර, ආදායම රු. 10,000 දී පරිභෝජන වියදම සොයන්න. (ලකුණු 2)

(ආ) සමතුලිත ජාතික ආදායම සොයන්න. (ලකුණු 2)

(ඇ) සමතුලිත නිමැවුම් මට්ටමේදී විදීම් සහ කාන්දු වීම් සමාන බව ඔප්පු කරන්න. (ලකුණු 2)

(v) තුලිත අයවැය ගුණකය යනු කුමක්ද? (ලකුණු 2)

## " ආ" කොටස
(මෙම කොටසින් අවම වශයෙන් ප්‍රශ්න 2ක් තෝරා ගන්න)

6. (i) මුදලේ බාහිර අගය නිර්වචනය කර එය පොදු මිල මට්ටම හා සම්බන්ධ වන ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 4)

(ii) සරල විනිමය සමීකරණය යනු ගණිතමය ප්‍රකාශනයකි. එය මත පදනම්ව මුදල් ප්‍රමාණවාදී න්‍යාය ගොඩනැගිනි. පහදන්න. (ලකුණු 4)

(iii) පදනම් මුදල්, මුදල් සැපයුම අතර ධන හා ගුණන සබඳතාවයක් ඇත. පහදන්න. (ලකුණු 4)

(iv) වාණිජ බැංකුවක සරල ශේෂ පත්‍රයක් පහතින් දක්වා ඇත. පැහැදිලි කරන්න.

| වගකීම් | | වත්කම් | |
|---|---|---|---|
| ඉල්ලුම් තැන්පතු - | රු. 50 000 | සංචිත | - රු. 8 000 |
| ප්‍රාග්ධනය - | රු. 10 000 | ණය | - රු. 38 000 |
| | | ස්ථාවර වත්කම් | - රු. 4 000 |
| මුළු වගකීම් | රු. 60 000 | මුළු වත්කම් | රු. 60 000 |

ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය 10% ක් නම්, බැංකු පද්ධතියේ අධි සංචිත ශූන්‍යවන විට, මුදල් සැපයුමේ වෙනස ගණනය කරන්න. (ලකුණු 4)

(v) මහ බැංකුවේ අරමුණ ලබා කර ගැනීම සඳහා විවට වෙළඳපොළ කටයුතු භාවිතා කරන ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 4)

7. (i) මිල යාන්ත්‍රණය මඟින් ආර්ථික කාර්යක්ෂමතාවය සඳහා මග පෙන්වීම් කරනු ලබන ආකාරයත්, එය දිරිමත් කරනු ලබන ආකාරයත් පැහැදිලි කරන්න. (ලකුණු 4)

(ii) බදු ආපාතය සහ ඕනෑම බදු මූලධර්මයක් අතර ඇති සම්බන්ධතාවය පැහැදිලි කරන්න. (ලකුණු 4)

(iii) ඉහළ ආදායම් ලබන කුටුම්භ ඉලක්ක කර, ආදායම් බදු අනුපාතය ඉහළ දැමීමේ සාර්ව ආර්ථික ප්‍රතිවිපාක සාකච්ජා කරන්න. (ලකුණු 4)

(iv) "චක්‍රීය රාජ්‍ය මූල්‍ය හිඟයට වඩා ව්‍යුහාත්මක රාජ්‍ය මූල්‍ය හිඟය භයානක වේ." පහදන්න. (ලකුණු 4)

(v) ශ්‍රී ලංකාව ණය ප්‍රතිව්‍යුහගතකරණය කිරීමේ වැදගත්කම පැහැදිලි කරන්න. (ලකුණු 4)

8. (i) සාපේක්ෂ වාසිය, නිරපේක්ෂ වාසිය සහ තරඟකාරීත්වයේ වාසිය යන සංකල්ප පැහැදිලි කරන්න. (ලකුණු 6)

(ii) "භාණ්ඩ වෙළඳ අනුපාතය වාසිදායක වුවද ආදායම් වෙළඳ අනුපාතය අවාසිදායක විය" මෙය සිදුවිය හැකිද? පැහැදිලි කරන්න. (ලකුණු 2)

(iii) ශ්‍රී ලංකාවේ ජාත්‍යන්තර වෙළඳාමේ දිශානතියට අනුව ඇමරිකාව වැදගත් ආර්ථිකයකි. ශ්‍රී ලංකාවේ ජාත්‍යන්තර වෙළඳාමට අදාළව ආනයන හා අපනයන මූලාශ්‍ර පදනම් කර ගනිමින් මෙම ප්‍රකාශය තහවුරු කරන්න. (ලකුණු 4)

(iv) ශ්‍රී ලංකාවේ ගෙවුම් ශේෂය සම්බන්ධයෙන් පහත සඳහන් ගනුදෙනු සඳහා අදාළ ගිණුම්වල නම් සහ ද්විත්ව සටහන් ලියන්න.

(අ) දිට්වා ව්‍යසනය වෙනුවෙන් ශ්‍රීලංකාවට ආධාර ලෙස භාණ්ඩ තොග ලැබීම.

(ආ) ශ්‍රී ලංකාව විසින් ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් ණය මුදලක් ලබා ගැනීම.

(ඇ) ශ්‍රී ලංකාවේ ඩොලර් සංචිත භාවිතා කරමින් මූල්‍යමය රන් මිලදී ගැනීම.

(ඈ) ඊශ්‍රායෙලයේ සේවය කරන නිමල් ඔහුගේ වැටුප ශ්‍රී ලංකාවේ වෙසෙන තම මවට එවීම. (ලකුණු 4)

(v) "මැද පෙරදිග පවතින යුධ තත්වය හේතුවෙන් බොරතෙල් මිල ඉහළ ගොස් ඇත." මෙය රුපියලේ විදේශ අගයට සිදු කරන බලපෑම ප්‍රස්ථාර ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 4)

9. (i) "ආර්ථික වර්ධනය ප්‍රමාණාත්මක සංකල්පයක් වන අතර ආර්ථික සංවර්ධනය ගුණාත්මක සංකල්පයකි." පහදන්න. (ලකුණු 4)

(ii) "තිරසාර සංවර්ධනය" සංකල්පය පැහැදිලි කරන්න. (ලකුණු 4)

(iii) ආර්ථික වර්ධනයේ පිරිවැය සඳහන් කරන්න. (ලකුණු 4)

(iv) මානව සංවර්ධන දර්ශකයේ ශක්තීන් නම් කරන්න. (ලකුණු 4)

(v) දුගීබව තුරන් කිරීමේ ක්‍රියාවලියේදී ශ්‍රී ලංකාව මුහුණ පාන ගැටළු කවරේද? (ලකුණු 4)

10. (i) ශ්‍රී ලංකාව වැනි ආර්ථිකයන් පොසිල ඉන්ධන මූලාශ්‍රවල සිට පුනර්ජනනීය බලශක්ති මූලාශ්‍ර දක්වා යොමු වීමේ ආර්ථික ප්‍රතිලාභ මොනවාද? (ලකුණු 4)

(ii) ශ්‍රී ලංකාවේ ආර්ථික වර්ධන ක්‍රියාවලිය සඳහා වර්තමානයේ පවතින මැදපෙරදිග යුද්ධමය තත්වය කරනු ලබන ආර්ථික බලපෑම් කවරේද? (ලකුණු 5)

(iii) "මෑත කාලයේදී රාජ්‍ය ව්‍යවසායන්ගේ කාර්යඵලවල ධනාත්මක නැඹුරුවක් ඇත." ශ්‍රී ලංකාවේ රාජ්‍ය ව්‍යවසායන් සඳහා ඇති පොදු විවේචන මොනවාද? (ලකුණු 5)

(iv) පසුගිය වසර කිහිපයේදී ශ්‍රී ලංකාවේ විදේශ විනිමය සංචිත ඉහළ ගොස් ඇත.

(අ) රටක විදේශ විනිමය සංචිත යනු මොනවාද? (ලකුණු 1)

(ආ) ශ්‍රී ලංකාවේ විදේශ විනිමය සංචිතවල සංයුතිය දක්වන්න. (ලකුණු 2)

(ඇ) ශ්‍රී ලංකාවේ ජීවත්වන මිනිසුන්ගේ ජීවන තත්ත්වය කෙරෙහි විදේශ විනිමය සංචිතවල වැඩිවීම කරනු ලබන ධනාත්මක බලපෑම් මොනවා ද? (ලකුණු 3)


iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers - Model Answers - Study Resources

සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

තෙවන වාර පරීක්ෂණය
மூன்றாம் தவணைப் பரீட்சை - 2026
Third Term Test

| ශ්‍රේණිය / தரம் / Grade | 13 | විෂය / பாடம் / Subject | Economic | පත්‍රය / வினாத்தாள் / Paper | I | පැය / மணித்தியாலம் / Hours | 2 |
|---|---|---|---|---|---|---|---|

| Question Number | Answer Number | Question Number | Answer Number | Question Number | Answer Number | Question Number | Answer Number | Question Number | Answer Number |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1. | 3 | 11. | 5 | 21. | 3 | 31. | 4 | 41. | 3 |
| 2. | 3 | 12. | 4 | 22. | 2 | 32. | 2 | 42. | 2 |
| 3. | 3 | 13. | 2 | 23. | 3 | 33. | 2 | 43. | 2 |
| 4. | 3 | 14. | 2 | 24. | 1 | 34. | 3 | 44. | 1 |
| 5. | 4 | 15. | 3 | 25. | 1 | 35. | 4 | 45. | 3 |
| 6. | 2 | 16. | 2 | 26. | 2 | 36. | 3 | 46. | 3 |
| 7. | 1 | 17. | 5 | 27. | 1 | 37. | 2 | 47. | 2 |
| 8. | 3 | 18. | 1 | 28. | 5 | 38. | 2 | 48. | 1 |
| 9. | 2 | 19. | 3 | 29. | 2 | 39. | 2 | 49. | 3 |
| 10. | 1 | 20. | 3 | 30. | 2 | 40. | 2 | 50. | 3 |



iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers • Study Resources

සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

තෙවන වාර පරීක්ෂණය
மூன்றாம் தவணைப் பரீட்சை - 2026
Third Term Test

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 13 | විෂය / பாடம் / Subject: Economic | පත්‍රය / வினாத்தாள் / Paper: II | පැය / மணித்தியாலம் / Hours: 3 |

01. කුඩා ඉඩමක හිමිකරුවන ගොවියෙකු සතුව පොල් ගස් කිහිපයක් ඇති අතර ඔහු පොල්තෙල් නිෂ්පාදනය කිරීමට සැලසුම් කරයි. ඒ සඳහා ඔහු කම්කරුවන් දෙදෙනෙකු බඳවා ගනී. කෙසේ වෙතත්, පොල් ප්‍රමාණය සහ සේවකයින් සංඛ්‍යාව සීමිතය. පොල් වෙළඳපොලේ විකිණිය යුතුද නැතහොත් ඒවායින් පොල්තෙල් නිෂ්පාදනය කළ යුතුද යන්න ගොවියා තීරණය කළ යුතුය. අවසානයේ ඔහු පොල් විකිණීම වෙනුවට පොල්තෙල් නිෂ්පාදනය කිරීමට තීරණය කරයි.

(i) ඉහත සිදුවීම ඇසුරින් හිඟකම, තේරීම, ප්‍රතිෂ්ඨාපනය කළ හැකි සම්පත් සහ අවස්ථික පිරිවැය යන සංකල්ප පැහැදිලි කරන්න. (ලකුණු 04)

(ii) "යම් භාණ්ඩයක් නිෂ්පාදනය වැඩි කරන විට එහි ආවස්ථික පිරිවැය ඉහළ යයි." නිෂ්පාදන හැකියා මායිම් වක්‍රය සහ එම වක්‍රයේ හැඩයට බලපාන හේතු ඇසුරින් මෙම ප්‍රකාශය පැහැදිලි කරන්න. (ලකුණු 4යි)

(iii) නිෂ්පාදන හැකියා මායිම් වක්‍ර භාවිතයෙන් පහත සිදුවීම් පැහැදිලි කරන්න.
(අ) ශ්‍රී ලංකා ආර්ථිකයට "දිට්වා" සුළි කුණාටුවෙන් ඇතිවූ බලපෑම.
(ආ) මැදපෙරදිග යුද ගැටුම් ශ්‍රී ලංකාවට බලපාන ආකාරය.
(ඇ) ශ්‍රී ලංකාවේ තේ සඳහා පවතින ඉල්ලුම අඩුවීම.
(ඈ) කෘෂි කාර්මික අංශය සඳහා ඩ්‍රෝන තාක්ෂණය භාවිත කිරීම. (ලකුණු 4යි)

(iv) "වෙළඳපොළ ආර්ථික පද්ධතියක ගාමක බලවේගයක් වන්නේ ස්වාර්ථයයි" උදාහරණයක් සහිතව සාකච්ඡා කරන්න. (ලකුණු 02)

(v) විධාන ආර්ථික පද්ධතියක පවතින අවාසි මොනවාද ? (ලකුණු 02)

(vi) නූතන ආර්ථික පද්ධතිය තුළ සමාජ ප්‍රාග්ධනයේ කාර්ය භාරය කුමක්ද ? (ලකුණු 02)

(i). හිඟකම , තේරීම, ප්‍රතිෂ්ඨාපනය කල හැකි සම්පත් හා අවස්ථා පිරිවැය

**හිඟකම**

හිඟකම යනු අසීමිත අවශ්‍යතා හා ආශාවන්ට සාපේක්ෂව සම්පත් සීමිත වීමයි. මෙම අවස්ථාවේදී ගොවියා සතුව ඇත්තේ සීමිත පොල් ප්‍රමාණයක්, කම්කරුවන් සහ ඉඩම් පමණක් බැවින් ඔහුට අසීමිත නිෂ්පාදනයක් කිරීමට හෝ කැමති සෑම දෙයක්ම කිරීමට නොහැක. (ලකුණු 1)

**තේරීම**

සම්පත් හිඟ බැවින් හා ඒවායේ විකල්ප භාවිත ඇති බැවින් ගොවියාට තේරීමක් කළ යුතුය. ඔහු පොල් වෙළඳපොළේ විකිණීමද නැතිනම් පොල්තෙල් නිෂ්පාදනයට යොදා ගැනීමද යන්න තීරණය කළ යුතුය. (ලකුණු 1)



iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

**ප්‍රතිෂ්ඨාපනය කල හැකි සම්පත්**

ප්‍රතිෂ්ඨාපනය කල හැකි සම්පතක් යනු කාලයත් සමඟ ස්වභාවිකව නැවත උත්පාදනය වන සම්පතකි. පොල් ගස් නිසි ලෙස නඩත්තු කළහොත් වාරයෙන් වාරයට නැවත පොල් ලබා දෙන බැවින් පොල් ප්‍රතිෂ්ඨාපනය කල හැකි සම්පතකි.

(ලකුණු 1)

**අවස්ථික පිරිවැය**

අවස්ථික පිරිවැය යනු තේරීමක් කිරීමේදී අත්හැර දමන ඊළඟ හොඳම විකල්පයේ වටිනාකමයි. ගොවියා පොල් විකිණීම වෙනුවට පොල්තෙල් නිෂ්පාදනය තෝරාගත් බැවින්, පොල් විකිණීමෙන් උපයා ගත හැකිව තිබූ ආදායම ඔහුගේ අවස්ථික පිරිවැය වේ. (ලකුණු 1)

(ii) "එක් භාණ්ඩයක වැඩි ප්‍රමාණයක් නිෂ්පාදනය කරන විට අවස්ථික පිරිවැය ඉහළ යයි" යන ප්‍රකාශය PPC භාවිතයෙන් පැහැදිලි කිරීම

මෙම ප්‍රකාශය නිෂ්පාදන හැකියා වක්‍රය (Production Possibility Curve - PPC) සහ එහි මූලයට අවතල (Concave) හැඩය මගින් පැහැදිලි කළ හැක. (ලකුණු 01)

වැඩෙන ආවස්ථික පිරිවැය රූප සටහන (01 ලකුණ)

වැඩිවන ආවස්ථික පිරිවැය

නිෂ්පාදන හැකියා මායිම් වක්‍රයක මායිම මත නිෂ්පාදනයේ යෙදෙන විට එක් භාණ්ඩයක නිෂ්පාදනය සමාන ඒකක ප්‍රමාණයකින් වැඩි කරන විට අනෙක් භාණ්ඩයේ කැප කරන ප්‍රමාණය ක්‍රමයෙන් වැඩි කිරීමට සිදුවේ. එය වැඩෙන ආවස්ථික පිරිවැයයි. එබැවින් අතිරේක ඒකකයක් නිෂ්පාදනය කිරීමේ අවස්ථික පිරිවැය වැඩි වේ. (ලකුණු 1)

PPC අවතල වක්‍ර වීමට හේතුව

සම්පත් සියලු භාණ්ඩ නිෂ්පාදනය සඳහා සමාන ලෙස සුදුසු නොවේ. සමහර සම්පත් එක් භාණ්ඩයක් නිෂ්පාදනය කිරීමට අනෙක් භාණ්ඩයට වඩා සුදුසු බැවින් PPC බාහිරව වක්‍ර (bowed outward) වේ. (ලකුණු 1)

එමෙන්ම නිෂ්පාදන ශිල්පීය ක්‍රම වෙනස් වීමද හේතු වේ.

. (iii) (අ) ඩිට්වා සුළි කුණාටුව (Ditwa Cyclone)

- ඩිට්වා සුළි කුණාටුව හේතුවෙන් නිෂ්පාදන සම්පත් හානි වීම නිසා රටේ නිෂ්පාදන ධාරිතාව අඩුවේ.
- එම නිසා නිෂ්පාදන හැකියාව වක්‍රය (PPC/PPF) වමට (ඇතුළට) මාරු වේ.




(ආ) මැද පෙරදිග යුද්ධය ඉන්ධන මිලට දැඩි ලෙස බලපාන විට

- ඉන්ධන මිල විශාල ලෙස ඉහළ යාමෙන් නිෂ්පාදන වියදම් වැඩි වේ.
- ඉන්ධන හිඟය නිසා ඇතැම් කර්මාන්ත නිෂ්පාදනය නතර කිරීමටද සිදුවිය හැක.
- ඒ නිසා PPC/PPF වමට (ඇතුළට) මාරු වේ.






iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers · Model Answers · Study Resources

- ඉන්ධන මිල ඉහළ ගියත් නිෂ්පාදනයට දැඩි බලපෑමක් නොමැති විට

- නිෂ්පාදන හැකියාව වෙනස් නොවන බැවින් PPC මාරු නොවේ.
- නමුත් ඉහළ වියදම් හේතුවෙන් නිෂ්පාදනය අඩුවන නිසා PPC තුළ ඇති ලක්ෂ්‍යයකට (inefficient point) ගමන් කරයි.




(ඇ)තේ සඳහා ඇති ඉල්ලුම අඩුවීම

- තේ තවමත් නිෂ්පාදනය කළ හැකි නමුත් අපේක්ෂිත ප්‍රමාණයට අලෙවි නොවිය හැක.
- සම්පත් සම්පූර්ණයෙන් භාවිතා නොවීම හෝ වෙනත් භාණ්ඩ නිෂ්පාදනයට යොමු වීම සිදුවේ.
- එම නිසා PPC එක මාරු නොවී, PPC තුළ ඇති අකාර්යක්ෂම (inefficient) ලක්ෂ්‍යයකට ගමන් කරයි.




(ඈ) කෘෂිකමර්ාන්තයේ ඩ්‍රෝන තාක්ෂණය භාවිතා කිරීම

- ඩ්‍රෝන තාක්ෂණය භාවිතයෙන් කෘෂිකාමරීක ඵලදායිතාව වැඩි වේ.
- නව තාක්ෂණය නිසා රටේ නිෂ්පාදන හැකියාව වැඩි වන බැවින් PPC/PPF පිටතට (දකුණට) මාරු වේ.




(ලකුණු 4)

(iv) වෙළඳපොළ ආර්ථිකයක ස්වාර්ථය (Self-interest)

වෙළඳපොළ ආර්ථිකයක ව්‍යාපාරවලට නිෂ්පාදනය කිරීමට හෝ පාරිභෝගිකයන්ට මිලදී ගැනීමට කිසිවෙකු බල නොකරයි. සෑම කෙනෙකුම තමන්ගේ යහපත සඳහා ක්‍රියා කරයි. (ලකුණු 01)

- පාරිභෝගිකයන් අවම මිලකට හොඳම භාණ්ඩ හා සේවා ලබා ගැනීමට උත්සාහ කරයි. (ස්වාර්ථය = උපරිම තෘප්තිය ලබා ගැනීම)
- නිෂ්පාදකයන් උපරිම ලාභ උපයා ගැනීමට උත්සාහ කරයි. (ස්වාර්ථය අභිලාෂය = ලාභ උපරිම කර ගැනීම)

තමන්ගේ අරමුණු ඉටු කර ගැනීමට උත්සාහ කරන විට පාරිභෝගිකයන් සහ නිෂ්පාදකයන් එකිනෙකාට සේවය කිරීමට පෙළඹේ.

(ලකුණු 01)



iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

(v) මධ්‍යගත සැලසුම් ආර්ථිකයක අවාසි

- පාරිභෝගික තේරීම් සීමා වීම.
- අකාර්යක්ෂමතාව හා හිඟතා ඇති වීම.
- සම්පත් වැරදි ලෙස වෙන් කිරීම නිසා අතිරික්ත හෝ හිඟ නිෂ්පාදනයක් ඇති වීම.
- පුද්ගල නිදහස සීමා වීම.
- තරඟකාරිත්වය නොමැති නිසා නවෝත්පාදන හා ඵලදායීතාව අඩුවීම.
- තීරණ ගැනීමේදී නිලධාරිවාදී ප්‍රමාදයන් ඇති වීම. (කරුණු 2- ලකුණු 02)

(vi) සමාජ ප්‍රාග්ධනය (Social Capital)

සමාජ ප්‍රාග්ධනය යනු පුද්ගලයන් හා සංවිධාන අතර පවතින සබඳතා, විශ්වාසය, සහයෝගීතාව සහ පොදු සම්මතයන් වන අතර ඒවා ඔවුන්ට ආර්ථික කටයුතු ඵලදායී ලෙස එකට කටයුතු කිරීමට උපකාරී වේ.

ප්‍රධාන කාර්යභාර

- ආර්ථික සහයෝගීතාව ප්‍රවර්ධනය කරයි.
- ගනුදෙනු පිරිවැය අඩු කරයි.
- ව්‍යාපාර, ආයෝජන හා වෙළඳාම දිරිමත් කරයි.
- ඵලදායීතාව හා නවෝත්පාදන වැඩි දියුණු කරයි.
- සමාජ හා ආර්ථිකයක සංවර්ධනයට දායක වේ. (ලකුණු 02)

2. (i) පෙට්‍රල්වල මිල වැඩි වුවද, ඒ සඳහා ඇති ඉල්ලුම අඩු නොවිණි. හේතුව පහදන්න. (ලකුණු 02)

(ii) පෙට්‍රල්වල මිල වෙනස්වන ප්‍රතිශතාත්මක වෙනසට සමානව හෝ ඊට වඩා වැඩියෙන්, ඒ සඳහා ඇති සැපයුම වෙනස් නොවීමට හේතු මොනවාද? (ලකුණු 04)

(iii) අධ්‍යාපනය සඳහා ඇති ඉල්ලුම වැඩි වුවද, එහි වෙළඳපොළ මිල පහත වැටී ඇත. මෙම වෙළඳපොළ තත්වය ප්‍රස්ථාරයක් ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 04)

(iv) දෙන ලද අවස්ථාවකදී , අනෙකුත් සාධක නොවෙනස්ව පවතින විට, y භාණ්ඩයේ ඉල්ලුම් ප්‍රමාණය හෝ ඉල්ලුම, Y භාණ්ඩයේ මිලෙහි (Py) හෝ පාරිභෝගික ආදායමෙහි (Y) හෝ X භාණ්ඩයේ මිලෙහි (Px) හෝ වෙනස් වීමට දක්වන ලද ප්‍රතිචාරය පහත පරිදි වේ.

| Px | Y | Py | D/Qdy |
|---|---|---|---|
| රු. | රු. "000" | රු. | "ඒකක" |
| 24 | 50 | 40 | 200 |
| 30 | 200 | 32 | 300 |

y භාණ්ඩයේ ලක්ෂණ තුනක් ලියා දක්වන්න (ලකුණු 3)

(v) කල්පිත වෙළඳ පොළක අලෙවි වන කල්පිත භාණ්ඩයක් සම්බන්ධයෙන් පහත තොරතුරු සපයා ඇත.

මිල ඉල්ලුම් සමීකරණය = $Pd = 12- {}^{1}/9\,Q$

අධි ඉල්ලුම් සමීකරණය = $Ex \cdot D = 120 - 12P$

(අ) වෙළඳපොළ සමතුලිතය ගණනය කරන්න. (ලකුණු 2)

(ආ) සමතුලිතය ප්‍රස්ථාරිකව දක්වන්න. (ලකුණු 3)

(ඇ) සමතුලිතයේදී නිෂ්පාදන අතිරික්තය සහ පාරිභෝගිකයා ගෙවීමට කැමති වියදම ගණනය කරන්න. (ලකුණු 2)



iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers • Study Resources

(i) පෙට්‍රල් වල මිල වෙනස්වීම නිසා වෙනස් වන්නේ පෙට්‍රල් වල ඉල්ලුම් ප්‍රමාණයයි. එම නිසා පෙට්‍රල් වල මිල වැඩිවීම නිසා අඩුවන්නේ පෙට්‍රල් ඉල්ලුම නොව ඉල්ලුම් ප්‍රමාණයයි. (ලකුණු 2)

(ii) 1. පෙට්‍රල් ගබඩාවල ධාරිතාවය ස්ථාවර වීම.

2. පෙට්‍රල් සැපයුම වෙනස්කිරීමට දිගු කාලයක් ගතවීම.

3. පෙට්‍රල් නිෂ්පාදනයට යොදා ගැනෙන නිෂ්පාදන සාධකවල ආදේශන හැකියාව අඩු හෝ නොමැති වීම.

4. ආනයනික භාණ්ඩයක් නිසා, අනෙකුත් සාධකවල බලපෑම වැඩි වීම. (2 X 2 = ලකුණු 4)

(iii)




(ලකුණු2)

★ අධ්‍යාපනයට ඇති ඉල්ලුම වැඩි වීම නිසා, ඉල්ලුම් වක්‍රය $D_1$ සිට $D_2$ දක්වා දකුණට විතැන් වේ.

★ නමුත්, මිල පහත වැටීමට නම් අධ්‍යාපනයට ඇති සැපයුම, ඉල්ලුම වැඩිවනවාට වඩා වැඩි ප්‍රමාණයකින් වැඩි විය යුතුය. ($S_1$ සිට $S_2$ දක්වා දකුණට විතැන් විය යුතුය.) (ලකුණු2)

(iv) 1. මිල ඉල්ලුම් නම්‍යතාවය -2.5 ක් වන නිසා එය සාමාන්‍ය, අත්‍යවශ්‍ය නොවන භාණ්ඩයකි.

2. ආදායම් ඉල්ලුම් නම්‍යතාවය 1/6 ක් වන නිසා, එය සාමාන්‍ය අත්‍යවශ්‍ය භාණ්ඩයකි.

3. හරස් ඉල්ලුම් නම්‍යතාවය 2 ක් වන නිසා, එය X භාණ්ඩයට ප්‍රබල ආදේශක භාණ්ඩයකි.

(ලකුණු3)

(v) Pd = 12 - (1/9)Q
Qd = 108 - 9P
Ex. D = 120 - 12P
Ex. D = Qd - Qs

**Ex. D = Qd - Qs**
120 - 12P = 108 - 9P - Qs
Qs = 108 - 9P - 120 + 12P
**Qs = -12 + 3P**

(අ) Qd =Qs
108 - 9P = -12 + 3P
120 = 12P
P = රු. 10 /= (ලකුණු 1)

Qd = 108 - 9(10)
**Q = ඒකක 18** (ලකුණු 1)

හෝ
120 - 12P = 0
12P = 120
P = රු. 10 /= (ලකුණු 1)

10 = 12 - (1/9)Q
(1/9)Q = 2
**Q = ඒකක 18** (ලකුණු 1)

(ආ)




(ලකුණු 3)



iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers · Study Resources

(ඇ) නිෂ්පාදන අතිරික්තය (Producer Surplus): $= 1/2 \times (10 - 4) \times 18$
$= 1/2 \times 6 \times 18 =$ රු. 54 /= (ලකුණු 1)

පාරිභෝගිකයා ගෙවීමට කැමති වියදම (Consumer Willingness to Pay): $= 1/2 \times (12 + 10) \times 18$
$= 1/2 \times 22 \times 18$
$= 11 \times 18$
= රු. 198 /= (ලකුණු 1)

3. (i) යම්කිසි භාණ්ඩයකට සැපයුම්කරු වෙත ඒකක බද්ධක් පැනවීමේදී, මිල සැපයුම් නම්‍යතාවය අනුව සමාජ සුභසාධනයට වන බලපෑම ප්‍රස්ථාර ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 4)

(ii) "රජය නැවතත් ඉන්ධන වෙළඳපොළ සඳහා QR ක්‍රමවේදය හඳුන්වා දෙන ලදී." මෙහි ආර්ථික ප්‍රතිවිපාක ප්‍රස්තාරයක් ඇසුරින් පැහැදිළි කරන්න. (ලකුණු 4)

(iii) 'පවතින මැදපෙරදිග යුධ තත්වය නිසා, ආනයනික භාණ්ඩවල සහ ආනයනි අමුද්‍රව්‍ය භාවිතයෙන් නිපදවන භාණ්ඩවල මිල ගණන් වැඩිවුනි.' මෙම භාණ්ඩවල මිල උච්චාවචනයන් පාලනය කිරීම සඳහා ඔබගේ යෝජනා මොනවාද? (ලකුණු 2යි)

(iv) තරඟකාරී වෙළඳ පොළක අලෙවිවන භාණ්ඩයක් සම්බන්ධයෙන් පහත තොරතුරු ලබා දී ඇත:
* Qd = 27 - 3p (ඉල්ලුම් සමීකරණය)
* Qs = -5 + 5p (සැපයුම් සමීකරණය)

රජය විසින් රු. 1.60 ක ඒකක බද්දක් පනවන්නේ නම්, පහත දෑ ගණනය කරන්න.
(අ) සමතුලිතයට වන බදු බලපෑම.
(ආ) නිෂ්පාදන අතිරික්තයට වන බලපෑම.
(ඇ) පාරිභෝගික අතිරික්තයට වන බලපෑම.
(ඈ) ආර්ථික අතිරික්තයට වන බලපෑම.
(ඉ) අහිමි වූ ආර්ථික සුභසාධනය.
(2 x 5 = ලකුණු 10යි)

(i) යම් භාණ්ඩයකට සැපයුම්කරු වෙත ඒකක බද්ධක් පැනවීමේදී, මිල සැපයුම් නම්‍යතාවයට අනුව සමාජ සුභසාධනයට වන බලපෑම ප්‍රස්ථාර ඇසුරින් පැහැදිළි කරන්න.

- සමාජ සුභසාධනය යනු යම්කිසි ගණුදෙනුවකට සම්බන්ධ වන සියලු පාශර්වයන්ට, එම ගණුදෙනුව නිසා ඇතිකරගනු ලබන සුභසාධනයේ ශුද්ධ ප්‍රතිවිපාකයයි.
- බද්ධක් පැනවීම හේතුවෙන් රජයට ආදායමක් හිමිවන නිසා සමාජ සුභසාධනය, ආර්ථික අතිරික්තය සහ රාජ්‍ය ආදායමේ එකතුවට සමාන වේ. (ලකුණු 1)
- මිල ඉල්ලුම් නම්‍යතාව අඩුවන විට සමාජ සුභාසාධනයේ අහිමි වීම අඩුවේ. පුණර් අනම්‍ය සැපයුමක් සහිත භාණ්ඩයකට බද්ධක් පැනවූ විට සමාජ සුභාසාධනයේ අහිමි වීමක් නැත. (ලකුණු 1)




ඒකීය නම්‍ය සැපයුමකදී



iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers · Model Answers · Study Resources




පුණර් අනම්‍ය සැපයුමකදී ---- සමාජ සුභ සාධනයේ අභිම්වීමක් නැත

(ඕනෑම නිවැරදි ප්‍රස්ථාර 2 කට ලකුණු 1 බැගින් ලකුණු 2 යි)

(ii)




(නිවැරදි ප්‍රස්ථාර නිරූපනය ලකුණු 2 යි)

එක් පාරිභෝගිකයෙකුට මිලදී ගත හැකි උපරිම ප්‍රමාණය පිළිබඳ සීමාවක් Q1 ලෙස පැනවූ විට, වෙළෙඳපොළ තුළ,

1) අධි ඉල්ලුමක් හට ගනී. (Q1 – Q1) පෝලිමක් දක්නට ලැබීම.
2) අධි ඉල්ලුමක් මිලක් හට ගැනීම (කළුකඩ මිලක්)
3) නිෂ්පාදන අතිරික්තය වෙනස් වීම.
4) අතරමැදි පාශර්ව මැදිහත් වීම.
5) ආර්ථික සුභාසධනයේ අභිම් වීමක් හට ගැනීම.
6) වෙළෙඳපොළ ඒකක ගණන අඩුවීම.

(ඕනෑම කරුණු 2 කට ලකුණු 2 කි)

(iii)
1) ආනයනික භාණ්ඩ පාරිභෝජනය සීමා පැනවීම.
2) ආනයනික භාණ්ඩවලට ආදේශක වන දේශීය කමර්ාන්තවලට සහනාධාර සැපයුම.
3) භාණ්ඩ ආනයන කරුවන්ට සහාන්ධාර ලබාදීම.
4) ආනයනික අමුද්‍රව්‍ය වෙනුවට දේශීය අමුද්‍රව්‍ය භාවිතය දිරිමත් කිරීම.
5) ආනයනික අත්‍යවශ්‍ය භාණ්ඩ සඳහා තොග රැස්කර තබා ගැනීම.

(ඕනෑම කරුණු 2 කට ලකුණු 2 කි)



iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers · Model Answers · Study Resources

(iv) (අ)

බදු පෙර සමතුලිතය

Qd = Qs

27 -3P = -5 +5P

$\frac{40}{8} = \frac{8P}{8}$

රු. 4/- = සමතුලිත මිල

Qd = 27 – 3 x 4

27 – 12

සමතුලිත ප්‍රමාණය = ඒකක 15 යි

බදු පසු සමතුලිතය

Qd = $Qs_t$

27 -3P = -13 +5P

$\frac{40}{8} = \frac{8P}{8}$

රු. 5/- = බදු පසු සමතුලිත මිල

Qd = 27 – 3 x 5

සමතුලිත ප්‍රමාණය = 12 යි

සමතුලිත මිල රු. 1 කින් වැඩිවේ.
සමතුලිත ප්‍රමාණය ඒකක 3 කින් අඩුවේ. (ලකුණු 2 යි)

(ආ)

බදු පෙර නිෂ්පාදන අතිරික්තය
= ½ x (4 – 1 ) x 15
= ½ x 3 x 15
= රු. 22.50

බදු පසු නිෂ්පාදන අතිරික්තය
= ½ x (3.40 – 1 ) x 12
= ½ x 2.40 x 12
= රු. 14.40

නිෂ්පාදන අතිරික්තය රු. 8.10 කින් අඩුවේ. (ලකුණු 2 යි)

(ඇ)

බදු පෙර පාරිභෝගික අතිරික්තය
= ½ x (9[5] – 4 ) x 15
= රු. 37.50

බදු පසු පාරිභෝගික අතිරික්තය
= ½ x (9 – 5 ) x 12
= = ½ x 4 x 12
= රු. 24

පාරිභෝගික අතිරික්තය රු. 13.50 කින් අඩුවේ. (ලකුණු 2 යි)

(ඈ)

බදු පෙර ආර්ථික අතිරික්තය
= නිෂ්පාදන අතිරික්තය + පාරිභෝගික අතිරික්තය
= රු. 22.50 + රු. 37.50
= රු. 60.00

බදු පසු ආර්ථික අතිරික්තය
= නිෂ්පාදන අතිරික්තය + පාරිභෝගික අතිරික්තය
= රු. 14.40 + රු. 24
= රු. 38.40

ආර්ථික අතිරික්තය රු. 31.60 කින් අඩුවේ. (ලකුණු 2 යි)

(ඉ) අහිමිවූ ආර්ථික සුභසාධනය
= ½ x 1.60 (15 - 12 )
= ½ x 1.60 x 3
= රු. 2. 40 යි (ලකුණු 2 යි)



iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers · Model Answers · Study Resources

4. (i) සවිනි 'රවිනි' සමාගමේ මෘදුකාංග ඉංජිනේරුවරියක ලෙස සේවය කරමින් රු. 80,000 ක මාසික වැටුපක් ලබයි. ඇය රැකියාවෙන් ඉල්ලා අස්වී, වාර්ෂිකව 10% ක පොලියක් ලැබෙන ඇයගේ රු. 500 000 ක ඉතුරුම් ප්‍රාග්ධනය ලෙස යොදාගෙන "බිනුරි" නමින් සපත්තු නිෂ්පාදන ආයතනයක් ආරම්භ කිරීමට තීරණය කරයි. ඇය රු. 30 000 බැගින් වූ මාසික වැටුප් සේවකයින් 4 දෙනෙකු යොදවා බඳවා ගනී. ඇයගේ සමාගමේ මාසික පිරිවැය පහත පරිදි වේ:

* අමුද්‍රව්‍ය රු. 100 000
* ගොඩනැගිලි කුලිය රු. 20 000
* විදුලිය රු. 5 000
* ප්‍රවාහනය: රු. 10,000

සවිනි රු. 5,000 බැගින් සපත්තු 100ක් විකිණීමට අපේක්ෂා කරන අතර අවම වශයෙන් රු. 80,000ක මාසික ලාභයක් බලාපොරොත්තු වේ.
පහත සඳහන් දෑ ගණනය කරන්න:

(අ) ඍජු පිරිවැය සහ වක්‍ර පිරිවැය. (ආ) ආර්ථික ලාභය සහ ගිණුම්කරණ ලාභය. (ලකුණු 4)

(ii) ආන්තික පිරිවැය )MC) සහ සාමාන්‍ය පිරිවැය )AC) වක්‍ර අතර පවතින සම්බන්ධතාවය පැහැදිලි කරන්නකෙටි . කාලීන නිෂ්පාදනයේදී මෙම වක්‍ර'U' හැඩයක් ගැනීමට හේතුව කුමක්ද? (ලකුණු 04)

(iii) පරිමාණානුකූල පිරිමැසුම් සහ පරිමාණානුකූල නොපිරිමැසුම් ඇති වීමට බලපාන හේතු මොනවාද? (ලකුණු 04)

(iv) පූර්ණ තරගකාරී ආයතනයක් "මිල ගනුවකු" ලෙස ක්‍රියා කළ යුත්තේ ඇයි? පැහැදිලි කරන්න. (ලකුණු 02)

(v) ඒකාධිකාරී වෙළඳපොළ සහ ඒකාධිකාරී තරගකාරී වෙළඳපොළ අතර වෙනස්කම් මොනවාද? (ලකුණු 02)

(vi) ආර්ථික බදු කුලිය සහ සංක්‍රාම ඉපයීම සාධක සැපයුම් නම්‍යතාවය මත රඳා පවතී සුදුසු රූප .සටහන් ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 04)

(i) (අ) **<u>ඍජු පිරිවැය</u>** (Explicit Costs) ගණනය කිරීම

අමුද්‍රව්‍ය = රු. 100,000
වැටුප් = රු. 120,000
විදුලි බිල් = රු. 5,000
කුලිය = රු. 20,000
ප්‍රවාහන වියදම් = රු. 10,000

මුළු ඍජු පිරිවැය = රු. 255,000 (ලකුණු 01)

**<u>වක්‍ර පිරිවැය</u>** (Implicit Costs)

කැප කල වැටුප = රු. 80,000

ඉතිරිකිරීම් මත අහිමි වූ පොලිය:

500,000 × 10% = රු. 50,000 (වාෂරීක)

50,000 ÷ 12 = රු. 4,167 (මාසික)

මුළු වක්‍ර පිරිවැය = රු. 84,167 (ලකුණු 01)



iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers · Model Answers · Study Resources

(ආ). **<u>ගිණුම්කරණ ලාභය</u>** (Accounting Profit)

මුළු ආදායම = 100 × 5,000 = රු. 500,000

ගිණුම්කරණ ලාභය = මුළු ආදායම − ගිණුම් කරණ පිරිවැය

= 500,000 − 255,000

= රු. 245,000 (ලකුණු 01)

ආර්ථික **<u>ලාභය</u>** (Economic Profit)

ආර්ථික ලාභය = මුළු ආදායම − (ඍජු පිරිවැය + වක්‍ර පිරිවැය)

= 500,000 − (255,000 + 84,167)

= රු. 160,833 (ලකුණු 01)

(ii) ආන්තික පිරිවැය හා සාමාන්‍ය පිරිවැය අතර සම්බන්ධය

ආන්තික පිරිවැය (MC) යනු අතිරේක ඒකකයක් නිෂ්පාදනය කිරීමේ පිරිවැයයි.

සාමාන්‍ය පිරිවැය (AC) යනු මුළු පිරිවැය නිෂ්පාදන ප්‍රමාණයෙන් බෙදූ විට ලැබෙන පිරිවැයයි.එනම් එක ඒකකයක පිරිවැයයි.

සම්බන්ධතාව:

- MC < AC නම් AC පහළ යයි.
- MC > AC නම් AC ඉහළ යයි.
- MC = AC නම් AC අවම අගයට පත් වේ.

එබැවින් MC වක්‍රය AC වක්‍රය එහි අවම ලක්ෂ්‍යයේදී හරහා ඉහළට ගමන් කරයි. (ලකුණු 02)

<u>කෙටි කාලීනව සාමාන්‍ය පිරිවැය වක්‍රය U-හැඩැති වීමට හේතු</u>

AC පහළ යන අවධිය

- විචල්‍ය සාධකයට වැඩි ප්‍රතිලාභ ලැබීම.
- ස්ථාවර සාධක වඩා කාර්යක්ෂමව භාවිතා කිරීම.
- ශ්‍රම විශේෂීකරණය හා කාර්ය බෙදීම.

AC ඉහළ යන අවධිය

- හීනවන ආන්තික ඵල නීතිය ක්‍රියාත්මක වීම.
- ස්ථාවර සාධක අධික ලෙස භාවිතා වීම.
- අතිරේක සේවකයන්ගේ ඵලදායීතාව අඩුවීම.

(ලකුණු 02)



iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers · Model Answers · Study Resources

(iii) ආර්ථික පිරිමැසුම් (Economies of Scale)

- තාක්ෂණික ආර්ථිකතා.
- කළමනාකරණ ආර්ථිකතා.
- තොග මිලදී ගැනීමේ ආර්ථිකතා.
- මූල්‍ය ආර්ථිකතා. (ලකුණු 02)

ආර්ථික නොපිරිමැසුම් (Diseconomies of Scale)

- කළමනාකරණ අපහසුතා.
- සන්නිවේදන ගැටලු.
- ශ්‍රම අකාර්යක්ෂමතාව.
- අධික නිලධාරිවාදය හා තදබදය. (ලකුණු 02)

(iv) පූර්ණ තරඟකාරී වෙළඳපොළක ආයතනයක් මිල භාරගන්නෙකු (Price Taker) වන්නේ ඇයි?

- වෙළඳපොළේ විකුණුම්කරුවන් හා ගැනුම්කරුවන් විශාල සංඛ්‍යාවක් සිටී.
- නිෂ්පාදන සියල්ල සමජාතීය (homogeneous) වේ.
- තනි ආයතනයකට වෙළඳපොළ මිලට බලපෑම් කළ නොහැක.

එබැවින් වෙළඳපොළ මිල ඉල්ලුම හා සැපයුම මගින් තීරණය වන අතර සෑම ආයතනයක්ම එම මිල පිළිගත යුතුය.

(ලකුණු 02)

(v) ඒකාධිකාරී වෙළඳපොළ හා ඒකාධිකාරී තරඟකාරී වෙළඳපොළ අතර වෙනස්කම්

| ලක්ෂණය | ඒකාධිකාරය | ඒකාධිකාරී තරඟය |
|---|---|---|
| විකුණුම්කරුවන් සංඛ්‍යාව | එක් විකුණුම්කරුවෙක් | බොහෝ විකුණුම්කරුවන් |
| භාණ්ඩයේ ස්වභාවය | සමීප ආදේශක නැත | ආදේශක සහිත වෙනස්කළ භාණ්ඩ |
| ප්‍රවේශ හා පිටවීම | දැඩි බාධක | බාධක නොමැත |
| තරඟකාරිත්වය | නොමැත | ඉහළයි |

(ලකුණු 02)

(vi) ආර්ථික බදු කුලිය (Economic Rent) හා සංක්‍රාම ඉපැයීම් (Transfer Earnings)

සංක්‍රාම ඉපැයීම් (Transfer Earnings)
නිෂ්පාදන සාධකයක් එහි වත්මාන භාවිතයේ රඳවා තබා ගැනීමට අවශ්‍ය අවම ගෙවීමයි.

ආර්ථික බදුකුලිය (Economic Rent)
සංක්‍රාම ඉපැයීම් ඉක්මවා ලැබෙන අතිරේක ගෙවීමයි. (ලකුණු 02)



iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers • Model Answers • Study Resources

- සාධක සැපයුම පූණර් නම්‍ය නම් → සියලු ඉපැයීම් සංක්‍රාම ඉපැයීම් වේ.
- සාධක සැපයුම පූණර් අනම්‍ය නම් මුලු ඉපයීම ආර්ථික බදු කුලිය වේ.

සාධක සැපයුම නම්‍ය නම් → ආර්ථික බදු කුලිය අඩුය.
සාධක සැපයුම අනම්‍ය → ආර්ථික බදු කුලිය වැඩිය. (රූප සටහන් 2 මගින් ලකුණු 02)

5. (i) මූලික ප්‍රවේශයන් තුන ඔස්සේ ජාතික ගිණුම් සැකසීමේ දී නිෂ්පාදිතයේ අගය සමාන වන්නේ ඇයි? (ලකුණු 4)

(ii) කල්පිත ආර්ථිකයක් සඳහා වන පහත සඳහන් දත්ත උපයෝගී කර ගනිමින් දළ දේශීය නිෂ්පාදිතය ගණනය කරන්න. (රු. මිලියන)

| | | | |
|---|---|---|---|
| * පුද්ගලික පරිභෝජන වියදම (C) | = 2400 | * තොග වෙනස් වීම | = 560 |
| * දළ දේශීය ස්ථාවර ප්‍රාග්ධන සම්පාදනය | = 1200 | * වටිනාකම් වෙනස්වීම් මත ආයෝජන | = 450 |
| * රජයේ මිලදී ගැනීම් (G) | = 2200 | * අපනයන (X) | = 400 |
| * ආනයන (M) | = 600 | * ශුද්ධ වක්‍ර බදු | =150 |

(ලකුණු 4)

(iii) "දළ දේශීය නිෂ්පාදිතය සහ දළ දේශීය වියදම යනු එකම සංකල්පයකි". විමසන්න. (ලකුණු 4)

(iv) රජයේ මැදිහත් වීම සහිත ආවෘත ආර්ථිකයක පහත සඳහන් දත්ත ඔබට සපයා ඇත.

ඉතුරුම් ශ්‍රිතය S = -2000 + 0.2Yd    ආයෝජනය I = 400
රජයේ මිලදී ගැනීම් G = 160    ස්වාධීන බදු T = 100

(අ) පරිභෝජන ශ්‍රිතය ව්‍යුත්පන්න කර, ආදායම රු. 10,000 දී පරිභෝජන වියදම සොයන්න. (ලකුණු 2)
(ආ) සමතුලිත ජාතික ආදායම සොයන්න. (ලකුණු 2)
(ඇ) සමතුලිත නිමැවුම් මට්ටමේදී විදීම් සහ කාන්දු වීම් සමාන බව ඔප්පු කරන්න. (ලකුණු 2)

(v) තුලිත අයවැය ගුණකය යනු කුමක්ද? (ලකුණු 2)

(i) මූලික ප්‍රවේශයන් තුන ඔස්සේ ජාතික ගිණුම් සැකසීමේ දී නිෂ්පාදිතයේ අගය සමාන වීමට හේතුව: ජාතික ගිණුම්කරණයේදී නිෂ්පාදන ප්‍රවේශය, ආදායම් ප්‍රවේශය සහ වියදම් ප්‍රවේශය යන තුනෙන්ම ලැබෙන අගයන් එකිනෙකට සමාන වේ. මෙයට හේතුව ආර්ථිකයක ආදායම් චක්‍රීය ප්‍රවාහයයි. එනම්, යම් කාල පරිච්ඡේදයක් තුළ නිපදවන ලද අවසාන භාණ්ඩ හා සේවාවල වෙළඳපොළ අගය (නිෂ්පාදිතය), එම නිෂ්පාදන මිලදී ගැනීම සඳහා දරන ලද මුළු වියදමට සමාන වන අතර, එම වියදම නිෂ්පාදන සාධක අයිතිකරුවන් අතර බෙදී යන මුළු සාධක ආදායමට සමාන වේ.

(ලකුණු 04)

(ii) දළ දේශීය නිෂ්පාදිතය (GDP) ගණනය කිරීම: වියදම් ප්‍රවේශයට අනුව GDP ගණනය කිරීමේ සූත්‍රය: GDP = C + I + G + (X - M) + සංඛ්‍යානමය වෙනස්කම්. මෙහි, දළ දේශීය ආයෝජනය (I) = දළ දේශීය ස්ථාවර ප්‍රාග්ධන සම්පාදනය + තොග වෙනස් වීම.

| | | | |
|---|---|---|---|
| • පුද්ගලික පරිභෝජන වියදම | | (C) | = 2,400 |
| • දළ දේශීය ආයෝජනය | (I) = 1,200 (ස්ථාවර) + 560 (තොග) | | = 1,760 |
| • රජයේ මිලදී ගැනීම් | | (G) | = 2,200 |
| • ශුද්ධ අපනයන (X - M) = 400 - 600 | | | = -200 |
| • වටිනාකම වෙනස්වීම (සංඛ්‍යානමය වෙනස්කම් ලෙස සලකා) | | | = 450 |

දළ දේශීය නිෂ්පාදිතය (GDP) = 2,400 + 1,760 + 2,200 + (-200) + 450 = රු. මිලියන 6,610.

(ලකුණු 04)



iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers · Model Answers · Study Resources

(iii) "දළ දේශීය නිෂ්පාදිතය (GDP) සහ දළ දේශීය වියදම (GDE) යනු එකම සංකල්පයකි" යන්න විමසීම: මෙම ප්‍රකාශය නිවැරදි නොවේ.

- දළ දේශීය වියදම (GDE) යනු රටක් තුළ දේශීයව නිපදවන භාණ්ඩ හා සේවා සඳහා දේශීය අංශ (පාරිභෝගිකයන්, ව්‍යාපාර සහ රජය) විසින් කරනු ලබන මුළු වියදමයි (GDE = C + I + G).
- දළ දේශීය නිෂ්පාදිතය (GDP) යනු රටක් තුළ නිපදවන මුළු අවසාන නිෂ්පාදිතයේ අගයයි. විවෘත ආර්ථිකයක දී GDP = GDE + ශුද්ධ අපනයන (X - M) වේ. එබැවින් මේවා සංකල්පීයව වෙනස් වේ. (ලකුණු 02)

(iv) ආවෘත ආර්ථිකයක සමතුලිතතාව ගණනය කිරීම: දත්ත: S = -2000 + 0.2Yd, I = 400, G = 160, T = 100

(අ) පරිභෝජන ශ්‍රිතය ව්‍යුත්පන්න කිරීම සහ C සෙවීම:

- C = Yd - S => C = Yd - (-2000 + 0.2Yd) = 2000 + 0.8Yd.
- Yd = Y - T බැවින්, C = 2000 + 0.8(Y - 100) => C = 1920 + 0.8Y
- Y = 10,000 වන විට, C = 1920 + 0.8(10,000) = 1920 + 8000 = රු. 9,920 (ලකුණු 02)

(ආ) සමතුලිත ජාතික ආදායම (Ye) සෙවීම:

- Y = C + I + G
- Y = 1920 + 0.8Y + 400 + 160
- 0.2Y = 2480 => Y = 2480 / 0.2 = රු. 12,400 (ලකුණු 02)

(ඇ) විදීම් (J) සහ කාන්දු වීම් (W) සමාන බව ඔප්පු කිරීම:

- විදීම් (Injections) J = I + G = 400 + 160 = 560
- කාන්දු වීම් (Leakages) W = S + T
- සමතුලිතතාවයේදී Yd = 12,400 - 100 = 12,300
- S = -2000 + 0.2(12,300) = -2000 + 2460 = 460
- W = 460 + 100 = 560
- එබැවින් J = W (560 = 560) වේ. (ලකුණු 02)

(v) තුලිත අයවැය ගුණකය (Balanced Budget Multiplier): රජයේ වියදම් (G) සහ බදු ආදායම (T) එකම ප්‍රමාණයකින් වෙනස් කළ විට, ජාතික ආදායම වෙනස් වන ප්‍රමාණය සහ එම වියදම් වෙනස් කළ ප්‍රමාණය අතර අනුපාතය තුලිත අයවැය ගුණකය ලෙස හැඳින්වේ. සරල ආර්ථික ආකෘතියක මෙහි අගය 1 කි. (ලකුණු 02)

6. (i) මුදලේ බාහිර අගය නිර්වචනය කර එය පොදු මිල මට්ටම හා සම්බන්ධ වන ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 4)

(ii) සරල විනිමය සමීකරණය යනු ගණිතමය ප්‍රකාශනයකි. එය මත පදනම්ව මුදල් ප්‍රමාණවාදී න්‍යාය ගොඩනැගිනි. පහදන්න. (ලකුණු 4)

(iii) පදනම් මුදල්, මුදල් සැපයුම අතර ධන හා ගුණන සබඳතාවයක් ඇත. පහදන්න. (ලකුණු 4)

(iv) වාණිජ බැංකුවක සරල ශේෂ පත්‍රයක් පහතින් දක්වා ඇත. පැහැදිලි කරන්න.

| වගකීම් | | වත්කම් | |
|---|---|---|---|
| ඉල්ලුම් තැන්පතු - | රු. 50 000 | සංචිත | - රු. 8 000 |
| ප්‍රාග්ධනය - | රු. 10 000 | ණය | - රු. 38 000 |
| | | ස්ථාවර වත්කම් | - රු. 4 000 |
| මුළු වගකීම් | රු. 60 000 | මුළු වත්කම් | රු. 60 000 |

ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය 10% ක් නම්, බැංකු පද්ධතියේ අධි සංචිත ශුන්‍යවන විට, මුදල් සැපයුමේ වෙනස ගණනය කරන්න. (ලකුණු 4)

(v) මහ බැංකුවේ අරමුණු ලඟා කර ගැනීම සඳහා විවට වෙළඳපොළ කටයුතු භාවිතා කරන ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 4)



www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers · Model Answers · Study Resources
iexamhub

**(06) (i) මුදලේ බාහිර අගය සහ අභ්‍යන්තර අගය:**

- **මුදලේ බාහිර අගය:** යනු දේශීය මුදල් ඒකකයක අගය විදේශීය මුදල් ඒකකයකින් ප්‍රකාශ කිරීමයි. මෙය විදේශ විනිමය අනුපාතිකය මගින් නිරූපණය වේ. (ලකුණු 01)
- **මුදලේ අභ්‍යන්තර අගය:** යනු දේශීය වෙළඳපොළේදී භාණ්ඩ හා සේවා මිලදී ගැනීමට මුදල් ඒකකයකට ඇති හැකියාවයි (එනම් මුදලේ මිලදී ගැනීමේ ශක්තියයි).
- **මිල මට්ටම සහ මුදලේ අගය අතර සම්බන්ධතාව:** පොදු මිල මට්ටම සහ මුදලේ අගය අතර **ප්‍රතිලෝම සම්බන්ධතාවයක්** පවතී. පොදු මිල මට්ටම ඉහළ යන විට මුදලේ මිලදී ගැනීමේ හැකියාව (අගය) පහළ යන අතර, මිල මට්ටම පහළ යන විට මුදලේ අගය ඉහළ යයි. (ලකුණු 02)
- මිල මට්ටම ඉහළ ගොස් දේශීය භාණ්ඩවල මිල ඉහළ යාම නිසා අපනයන ඉල්ලුම අඩුවීම හා ආනයන ඉල්ලුම වැඩිවීම සිදුවේ. මෙහි ප්‍රතිඵලයක් ලෙස විදේශ විනිමය වෙළඳපොළේදී දේශීය මුදලේ අගය **අවප්‍රමාණය වීම** (Depreciation) සිදු විය හැකිය. (ලකුණු 01)

**(ii) මුදල් ප්‍රමාණවාදී සිද්ධාන්තය (Quantity Theory of Money):**

- ඉර්වින් ෆිෂර් ගනුදෙනු ප්‍රවේශයට අනුව, යම් කාල පරිච්ඡේදයක් තුළ සිදුවන මුළු වියදම ($MV$), එම කාලය තුළ විකුණන ලද භාණ්ඩ හා සේවාවල මුළු වෙළඳපොළ වටිනාකමට ($PT$) සමාන වේ. එනම් $MV=PT$ වේ.
- මෙහි $M$ යනු මුදල් සැපයුම ද, $V$ යනු මුදලේ සංසරණ වේගය ද, $P$ යනු පොදු මිල මට්ටම ද, $T$ යනු ගනුදෙනු ප්‍රමාණය ද වේ.
- මිල්ටන් ෆ්‍රීඩ්මන් වැනි මුල්‍යවාදීන්ට අනුව, අනෙකුත් සාධක නොවෙනස්ව පවතින විට මුදල් සැපයුම ($M$) සහ පොදු මිල මට්ටම ($P$) අතර **සෘජු හා සමානුපාතික සම්බන්ධතාවයක්** පවතී.
- **MV=PT** නිවර්චනයක් ලෙස සත්‍ය වේ. මෙය ගණිතමය අනන්‍යතාවයක් ලෙස හැඳින්විය හැකිය.
- මෙය ව්‍යුත්පන්න කර ලබමින්. මෙහි පැහැදිලි කරන්නේ මුදල් සැපයුමේ වෙනස්වීම් සම්බන්ධතාවය මත පදනම්ව, මිල මට්ටම බලපාන බවයි. (ලකුණු 04)

**(iii) අධි බලැති මුදල් (High Powered Money / Monetary Base):**

- අධි බලැති මුදල් (හෝ මුදල් පදනම) යනු මහජනයා සතු ව්‍යවහාර මුදල් (Currency held by the public) සහ වාණිජ බැංකු සතු මුළු සංචිත (Reserves) වල එකතුවයි.
- මෙය ආර්ථිකයක මුදල් සැපයුම නිර්මාණය වීමේ පදනම ලෙස ක්‍රියා කරයි අධි බලැති මුදල් මුදල් සැපයුමේම කොටසකි. මහ බැංකුව විසින් නිකුත් කරන ලද වගකීමක් වන මුළු මුදල් ප්‍රමාණය මුදල් සැපයුම නිරූපණය කරයි.

- එබැවින් මුදල් සැපයුම සෘජුවම ඉහල යයි.
- ගුණන ප්‍රතිවිපාකය: වාණිජ බැංකු තම සංචිත භාවිතා කර ණය දීම මගින් ණය මැවීම සිදු කරයි.
- $M=m\times H$
- අධි බලැති මුදල්වල සුළු වැඩිවීමක් මුදල් සැපයුමේ විශාල වෙනසකට හේතු වේ. (ලකුණු 04)

(iv) අවශ්‍ය සංචිතය = 50,000×10%=5,000
අතිරික්ත සංචිතය = මුළු සංචිතය - අවශ්‍ය සංචිතය = 8,000−5,000=3,000
මුදල් ප්‍රගුණකය = $1/r$ = 1/10%=10
මුදල් සැපයුමේ වෙනස = අතිරික්ත සංචිතය × මුදල් ප්‍රගුණකය = 3,000×10=30,000 (ලකුණු 04)

(v)

- විවෘත වෙළඳපොළ විකුණුම්: එනම් මහ බැංකුව මගින් රජයේ සුරකුම්පත් විකිණීම සහ වාණිජ බැංකු ඒවා මිලදී ගැනීමයි. එවිට වාණිජ බැංකුවල සංචිත අඩුවී වාණිජ බැංකු මුදල් මැවීමේ හැකියාව අඩු වේ. එම නිසා මුදල් සැපයුම පහත වැටේ.
- මහ බැංකුවේ ප්‍රධාන අරමුණ වන දේශීය මුදලේ ස්ථාවරත්වය පවත්වාගෙන යාම හා ළඟා කර ගැනීම ඉටු කර ගත හැකිය. එනම් මුදල් සැපයුමේ අඩුවීම උද්ධමනය අඩු කරයි. (ලකුණු 04)



iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers · Model Answers · Study Resources

7. (i) මිල යාන්ත්‍රණය මගින් ආර්ථික කාර්යක්ෂමතාවය සඳහා මග පෙන්වීම් කරනු ලබන ආකාරයත්, එය දිරිමත් කරනු ලබන ආකාරයත් පැහැදිලි කරන්න. (ලකුණු 4)

(ii) බදු ආපාතය සහ ඕනෑම බදු මූලධර්මයක් අතර ඇති සම්බන්ධතාවය පැහැදිලි කරන්න. (ලකුණු 4)

(iii) ඉහළ ආදායම් ලබන කුටුම්භ ඉලක්ක කර, ආදායම් බදු අනුපාතය ඉහළ දැමීමේ සාර්ව ආර්ථික ප්‍රතිවිපාක සාකච්ඡා කරන්න. (ලකුණු 4)

(iv) "චක්‍රීය රාජ්‍ය මූල්‍ය හිඟයට වඩා ව්‍යුහාත්මක රාජ්‍ය මූල්‍ය හිඟය භයානක වේ." පහදන්න. (ලකුණු 4)

(v) ශ්‍රී ලංකාව ණය ප්‍රතිව්‍යුහගතකරණය කිරීමේ වැදගත්කම පැහැදිලි කරන්න. (ලකුණු 4)

(i) **මිල යාන්ත්‍රණය සම්පත් මගින් බෙදාහැරීමේ මාධ්‍යයකි.**

ඉල්ලුම ඉහල යන විට, භාණ්ඩ හා සේවා වල මිල ඉහල යන අතර ඉල්ලුම පහල යන විට මිල පහත වැටේ. මෙහිදී පුද්ගලික අංශය තම සම්පත් වඩාත් ඉල්ලුමක් ඇති භාණ්ඩ හා සේවා නිපදවීම සඳහා සම්පත් යොමු කරයි. වඩා වැඩි වටිනාකමක් දෙන භාණ්ඩ හා සේවා නිෂ්පාදනය සඳහා සම්පත් යොමුකෙරේ.

**මිල යාන්ත්‍රණය කායර්ක්ෂමතාවය ෛෙධමර්ත්කරයි.**

මිල යාන්ත්‍රණය තුලින් නිෂ්පාදකයන්ට අවශ්‍ය වන ශ්‍රමය, ප්‍රාග්ධනය වැනි සම්පත් වලට ගෙවිය යුතු වටිනාකම තීරණය කරයි. මෙය පාරිභෝගිකයාට අවශ්‍ය සම්පත් භාවිතය උත්තේජනය කරයි. (ලකුණු 04)

(ii) බදු ආපාතය සහ බදු මූලධමර් අතර පවතින සබඳතාවය ප්‍රධාන වශයෙන්ම බදු සාධාරණත්වය (Equity) යන මූලධමර්ය ඇසුරින් පහත පරිදි පැහැදිලි කළ හැකිය:

- බදු ආපාතය (Tax Incidence): යනු බද්දක අවසාන මූල්‍ය බර දරනු ලබන පාශර්වයයි. එනම්, රජයට බදු මුදල ගෙවීමට නීත්‍යානුකූලව බැඳී සිටින පුද්ගලයාට වඩා, එම බර සැබෑ ලෙසම දරන්නේ පාරිභෝගිකයාද නැතහොත් නිෂ්පාදකයාද යන්න මෙයින් අදහස් වේ. (ලකුණු 02)
- **<u>බදු මූලධමර්ය (Tax Principle):</u> ලෙස සාධාරණත්වය** හෝ ගෙවීමේ හැකියාව (Ability to Pay) පිළිබඳ මූලධමර්ය ගත හැකිය. මෙයින් අදහස් වන්නේ පුද්ගලයෙකු බදු ගෙවිය යුත්තේ තමන්ට දැරිය හැකි මූල්‍ය ශක්තිය අනුව බවයි.
- සම්බන්ධතාවය:
  - යම් බද්දක ආපාතය (බර) වැඩි වශයෙන් අඩු ආදායම්ලාභී පාරිභෝගිකයන් මත පතිත වේ නම් (උදා: වක්‍ර බදු), එය බදු සාධාරණත්වය යන මූලධමර්යට පටහැනිය. එවිට එම බද්ද ප්‍රතිගාමී (Regressive) බද්දක් ලෙස හැඳින්වේ.
  - නමුත් බදු ආපාතය වැඩි වශයෙන් ඉහළ ආදායම් ලබන පුද්ගලයන් මත පතිත වේ නම් (උදා: ප්‍රගතිගාමී ආදායම් බදු), එය බදු සාධාරණත්වය සහ ගෙවීමේ හැකියාව යන මූලධමර්යන්ට අනුකූල වේ. (ලකුණු 02)

හෝ

- **<u>කායර්ක්ෂමතා මූලධමර්ය (Principle of Efficiency):</u>** යහපත් බදු පද්ධතියක පවතින මෙම මූලධමර්යට අනුව, බද්දක් පැනවීමේදී එමගින් ආර්ථිකයේ සම්පත් බෙදාහැරීමේ රටාවට (Resource Allocation) සිදුවන අහිතකර බලපෑම හෙවත් විකෘතිය අවම විය යුතුය. එනම්, බද්ද නිසා සිදුවන අතිරික්ත හානිය (Deadweight Loss) අවම විය යුතුය.
- **සම්බන්ධතාවය:**
  - යම් භාණ්ඩයක් මත බදු පැනවූ විට, එහි බර (ආපාතය) බෙදී යන ආකාරය අනුව පාරිභෝගිකයන් සහ නිෂ්පාදකයන් තම තීරණ වෙනස් කරයි.
  - බදු ආපාතය නිසා පාරිභෝගිකයන් තම පරිභෝජනය හෝ නිෂ්පාදකයන් තම නිෂ්පාදනය විශාල වශයෙන් අඩු කරන්නේ නම්, එමගින් ආර්ථිකයට විශාල අතිරික්ත හානියක් සිදු වේ. එවැනි බද්දක් කායර්ක්ෂමතාවයෙන් තොර (Inefficient) බද්දක් ලෙස සැලකේ.



iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers • Model Answers • Study Resources

- ○ කායර්ක්ෂමතා මූලධමර්ය අනුව, බදු පැනවිය යුත්තේ ඉල්ලුම හෝ සැපයුම පූර්ණ අනම්‍ය මතය. මන්ද, එවැනි භාණ්ඩවල බදු ආපාතය (බර) පාරිභෝගිකයා හෝ නිෂ්පාදකයා මත පතිත වුවද, ඔවුන් තම මිලදී ගැනීම් හෝ විකිණීම් විශාල ලෙස වෙනස් නොකරන බැවින් ආථර්ිකයට සිදුවන සුභසාධන හානිය අවම වේ.

(iii) ආදායම් බදු යනු පුද්ගලයන්ගේ ආදායමෙන් සෘජුවම අයකරන බදු වන අතර ආදායම ඉහල යන විට බදු අනුපාතය ද ඉහල යන ආකාරයට සකස් කර ඇත. මෙනිසා බදු අය කිරීමෙන් පසු ලැබෙන ආදායම (disposable income) අඩු විය හැක.

- බදු ආදායම ඉහල යන අතර රජයේ මූල්‍ය ශක්තිය හා ආයෝජන මට්ටම ඉහල නැංවීමට උපකාරී වේ.
- බදු ක්‍රමයේදී බදු පදනම පුළුල් කිරීම වැදගත් වේ.
- ආදායම් බදු progressive වන අතර මෙය ආදායම් විෂමතාවය අඩු කිරීමට රුකුල් දෙයි. (ලකුණු 04)

**(iv)** මූල්‍ය හිඟය ප්‍රධාන කොටස් දෙකකට බෙදා දැක්විය හැකිය:

- **චක්‍රීය රාජ්‍ය මූල්‍ය හිඟය (Cyclical Budget Deficit):** මෙය ආර්ථිකයේ පවතින ව්‍යාපාර චක්‍රයේ ස්වභාවය මත ඇති වන්නකි. ආර්ථික පසුබෑමක් පවතින කාලයකදී බදු ආදායම පහත වැටීම සහ සුභසාධන වියදම් ඉහළ යාම නිසා මෙම හිඟය තාවකාලිකව ඇති වේ. ආර්ථිකය නැවත ප්‍රසාරණය වන විට මෙම හිඟය ස්වයංක්‍රීයව මගහැරී යයි. (ලකුණු 01)
- **ව්‍යුහාත්මක රාජ්‍ය මූල්‍ය හිඟය (Structural Budget Deficit):** ආර්ථිකය පූර්ණ රැකියා මට්ටමේ (Full employment) පවතින විට පවා පවතින හිඟය මින් අදහස් වේ. මෙයට හේතුව වන්නේ රජයේ දිගුකාලීන වියදම් රටාව සහ බදු ප්‍රතිපත්තිවල පවතින දුර්වලතාවයයි. (ලකුණු 01)

**භයානක වීමට හේතුව:** ව්‍යුහාත්මක හිඟය ආර්ථික වර්ධනය සමග ස්වයංක්‍රීයව විසඳෙන්නේ නැත. එය පාලනය කිරීමට නම් රජය සිය ප්‍රතිපත්තිමය වියදම් කපා හැරීම හෝ බදු ව්‍යුහය වෙනස් කිරීම අනිවාර්යයෙන් කළ යුතුය. මෙම හිඟය දිගින් දිගටම පැවතීමෙන් රටේ ණය බර දරාගත නොහැකි මට්ටමට පත්වන බැවින් එය චක්‍රීය හිඟයට වඩා භයානක ලෙස සැලකේ. (ලකුණු 02)

(v) ණය ප්‍රතිව්‍යුහගතකරණය යනු දැනට පවතින ණය ගෙවීමේ කොන්දේසි, එනම් ණය ආපසු ගෙවීමේ කාලය දීර්ඝ කිරීම, පොලී අනුපාත අඩු කිරීම හෝ මුළු ණය ප්‍රමාණයෙන් කොටසක් කපා හැරීම සඳහා ණය හිමියන් සමග එකඟතාවයකට පැමිණීමයි. ශ්‍රී ලංකාවට මෙහි වැදගත්කම කරුණු කිහිපයක් ඔස්සේ පැහැදිලි කළ හැකිය:

1. **ණය තිරසාරභාවය ඇති කිරීම (Debt Sustainability):** රටේ දළ දේශීය නිෂ්පාදිතයට සහ රජයේ ආදායමට සාපේක්ෂව දරාගත හැකි මට්ටමකට ණය බර අඩු කර ගැනීම මෙහි මූලික අරමුණයි.
2. **විදේශ විනිමය සංචිත ආරක්ෂා කර ගැනීම:** විදේශීය ණය හිමියන්ට විශාල වශයෙන් විදේශ විනිමය (ඩොලර්) ගෙවීමට සිදුවීම පාලනය කරමින්, එම මුදල් රටට අත්‍යවශ්‍ය ආහාර, ඖෂධ සහ ඉන්ධන වැනි දෑ ආනයනය කිරීමට වෙන් කර ගැනීමට අවස්ථාව ලැබේ.
3. **ආර්ථික ස්ථායීතාවය සහ විශ්වාසය ගොඩනැගීම:** ණය ප්‍රතිව්‍යුහගතකරණය මගින් රටේ මූල්‍ය විනයක් ඇති බව ජාත්‍යන්තරයට පෙන්වීම හරහා නැවතත් විදේශ ආයෝජන දිරිමත් කිරීමටත්, ජාත්‍යන්තර මූල්‍ය වෙළඳපොළට ප්‍රවේශ වීමටත් මග පෑදේ.



www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers · Model Answers · Study Resources

4. **මහජන සුභසාධනය සඳහා ප්‍රතිපාදන වෙන් කිරීම:** රජයේ ආදායමෙන් විශාල කොටසක් ණය වාරික සහ පොලී ගෙවීමට වැය කරනවා වෙනුවට, එම මුදල් අධ්‍යාපනය, සෞඛ්‍යය සහ යටිතල පහසුකම් සංවර්ධනය වැනි ජනතාවට සෘජුව ප්‍රතිලාභ ලැබෙන අංශ වෙත යොමු කිරීමට රජයට හැකියාව ලැබේ. (කරුණු 4- ලකුණු 04)

8. (i) සාපේක්ෂ වාසිය, නිරපේක්ෂ වාසිය සහ තරඟකාරීත්වයේ වාසිය යන සංකල්ප පැහැදිලි කරන්න. (ලකුණු 6)

(ii) "භාණ්ඩ වෙළඳ අනුපාතය වාසිදායක වුවද ආදායම් වෙළඳ අනුපාතය අවාසිදායක විය" මෙය සිදුවිය හැකිද? පැහැදිලි කරන්න. (ලකුණු 2)

(iii) ශ්‍රී ලංකාවේ ජාත්‍යන්තර වෙළඳාමේ දිශානතියට අනුව ඇමරිකාව වැදගත් ආර්ථිකයකි. ශ්‍රී ලංකාවේ ජාත්‍යන්තර වෙළඳාමට අදාළව ආනයන හා අපනයන මූලාශ්‍ර පදනම් කර ගනිමින් මෙම ප්‍රකාශය තහවුරු

(iv) ශ්‍රී ලංකාවේ ගෙවුම් ශේෂය සම්බන්දයෙන් පහත සඳහන් ගනුදෙනු සඳහා අදාළ ගිණුම්වල නම් සහ ද්විත්ව සටහන් ලියන්න.

(අ) දිට්වා ව්‍යසනය වෙනුවෙන් ශ්‍රීලංකාවට ආධාර ලෙස භාණ්ඩ තොග ලැබීම.

(ආ) ශ්‍රී ලංකාව විසින් ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් ණය මුදලක් ලබා ගැනීම.

(ඇ) ශ්‍රී ලංකාවේ ඩොලර් සංචිත භාවිතා කරමින් මූල්‍යමය රන් මිලදී ගැනීම.

(ඈ) ඊශ්‍රායෙලයේ සේවය කරන නිමල් ඔහුගේ වැටුප ශ්‍රී ලංකාවේ වෙසෙන තම මවට එවීම. (ලකුණු 4)

(v) "මැද පෙරදිග පවතින යුධ තත්වය හේතුවෙන් බොරතෙල් මිල ඉහළ ගොස් ඇත." මෙය රුපියලේ විදේශ අගයට සිදු කරන බලපෑම ප්‍රස්ථාර ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 4)

(i)

- **නිරපේක්ෂ වාසිය (Absolute Advantage):** එක් රටක් තවත් රටකට වඩා අඩු සම්පත් ප්‍රමාණයක් භාවිතා කරමින් කිසියම් භාණ්ඩයක් නිෂ්පාදනය කිරීමට හෝ දී ඇති සම්පත් ප්‍රමාණයකින් වැඩි නිෂ්පාදනයක් සිදු කිරීමට ඇති හැකියාවයි.
- **සාපේක්ෂ වාසිය (Comparative Advantage):** එක් රටක් තවත් රටකට සාපේක්ෂව අඩු ආවස්ථික පිරිවැයකින් කිසියම් භාණ්ඩයක් නිෂ්පාදනය කිරීමට ඇති හැකියාවයි. ජාත්‍යන්තර වෙළඳාමේ පදනම ලෙස මෙය සැලකේ.
- **තරගකාරීත්වයේ වාසිය (Competitive Advantage):** ආයතනයක් හෝ රටක් තම තරගකරුවන්ට වඩා උසස් වටිනාකමක් පාරිභෝගිකයාට ලබා දීමට ඇති සුවිශේෂී හැකියාවයි. මෙය අඩු පිරිවැය මත හෝ භාණ්ඩයේ සුවිශේෂී ගුණාංග (Differentiation) මත පදනම් විය හැකිය. (ලකුණු 2 x3= 06)

(ii) **ඔව්, මෙය සිදුවිය හැකිය.**

- **භාණ්ඩ වෙළඳ අනුපාතය (Terms of Trade - TOT):** යනු අපනයන මිල දර්ශකය සහ ආනයන මිල දර්ශකය අතර අනුපාතයයි.
- **ආදායම් වෙළඳ අනුපාතය (Income Terms of Trade):** යනු භාණ්ඩ වෙළඳ අනුපාතය අපනයන ප්‍රමාණ දර්ශකයෙන් (Export Volume Index) ගුණ කිරීමෙන් ලැබෙන අගයයි.
- අපනයන මිල ගණන් ඉහළ යාම නිසා TOT වාසිදායක වුවද, යම් හෙයකින් **අපනයන කරන ප්‍රමාණය (Volume) ඉතා විශාල ලෙස පහත වැටුණහොත්**, සමස්තයක් ලෙස ආදායම් වෙළඳ අනුපාතය අවාසිදායක (අඩු) විය හැකිය.

(ලකුණු 02)



iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers • Model Answers • Study Resources

(iii) ශ්‍රී ලංකාවේ ප්‍රධානතම අපනයන ගමනාන්තය වන්නේ ඇමරිකා එක්සත් ජනපදයයි. විශේෂයෙන්ම ශ්‍රී ලංකාවේ ප්‍රධාන අපනයන ආදායම් මාගර්ය වන නිමි ඇඳුම් සඳහා පවතින විශාලතම වෙළඳපොළ ඇමරිකාවයි. ආනයන මූලාශ්‍රයක් ලෙස ද ඇමරිකාව වැදගත් වන අතර, ශ්‍රී ලංකාවට වැඩිම විදේශ විනිමය ආදායමක් සහ වෙළඳ අතිරික්තයක් ලබා දෙන තනි රටක් ලෙස ඇමරිකාව ශ්‍රී ලංකාවේ ආර්ථිකයට ඉතා වැදගත් වේ. (ලකුණු 02)

- **නිමි ඇඳුම් අපනයනය:** ශ්‍රී ලංකාවේ ප්‍රධානතම අපනයන භාණ්ඩය වන නිමි ඇඳුම් සඳහා පවතින විශාලතම වෙළඳපොළ ඇමරිකාවයි. ශ්‍රී ලංකාවේ සමස්ත ඇඟලුම් අපනයනයෙන් 40% කට ආසන්න ප්‍රමාණයක් මිලදී ගන්නේ ඇමරිකාව විසිනි.
- **අනෙකුත් භාණ්ඩ:** නිමි ඇඳුම්වලට අමතරව තේ, රබර් ආශ්‍රිත නිෂ්පාදන (විශේෂයෙන් ඝන ටයර්) සහ කුළුබඩු සඳහා ද ඇමරිකාව ඉතා වැදගත් වෙළඳපොළකි.

ශ්‍රී ලංකාව බොහෝ රටවල් (උදාහරණ: ඉන්දියාව, චීනය) සමග ගනුදෙනු කිරීමේදී පවතින්නේ අවාසිදායක වෙළඳ හිඟයකි (ආනයන වියදම අපනයන ආදායමට වඩා වැඩි වීම). නමුත් ඇමරිකාව සමග ගනුදෙනු කිරීමේදී ශ්‍රී ලංකාවට පවතින්නේ වාසිදායක වෙළඳ අතිරික්තයකි. (ලකුණු 01)
එනම්, ඇමරිකාවට භාණ්ඩ විකුණා අප ලබන ආදායම, ඇමරිකාවෙන් භාණ්ඩ මිලදී ගැනීමට වැය කරන මුදලට වඩා වැඩිය. මෙය රටේ විදේශ විනිමය සංචිත ශක්තිමත් කිරීමට විශාල දායකත්වයක් සපයයි.
ඇමරිකාව ශ්‍රී ලංකාවට ප්‍රධාන අපනයන වෙළඳපොළක් වනවා සේම, අත්‍යවශ්‍ය භාණ්ඩ ලබා දෙන ආනයන මූලාශ්‍රයක් ද වේ.විශේෂයෙන්ම උසස් තාක්ෂණික යන්ත්‍ර සූත්‍ර (High-tech machinery), තිරිඟු පිටි, රසායනික ද්‍රව්‍ය සහ වෛද්‍ය උපකරණ වැනි දෑ ශ්‍රී ලංකාව ඇමරිකාවෙන් ආනයනය කරයි.
ශ්‍රී ලංකාවට වැඩිම විදේශ විනිමය ප්‍රමාණයක් උපයා දෙන, නිමි ඇඳුම් කර්මාන්තයේ පැවැත්ම තීරණය කරන සහ ශුද්ධ වෙළඳ අතිරික්තයක් ලබා දෙන රටක් වන බැවින්, ඇමරිකාව ශ්‍රී ලංකාවේ ජාත්‍යන්තර වෙළඳාමේදී ඉතාමත් තීරණාත්මක සහ වැදගත් ආර්ථිකයක් ලෙස සැලකේ.

2025 වර්ෂයේදී **ඇමරිකා එක්සත් ජනපදය (USA)** වෙතින් ලැබූ මුළු අපනයන ආදායම **ඇමරිකානු ඩොලර් මිලියන 3,000ක්** වූ අතර, එය 2024 වසරේ වාර්තා වූ ඩොලර් මිලියන 2,911 ට සාපේක්ෂව **3.1% ක වර්ධනයකි**,. විවිධ බදු සංශෝධන සහ ප්‍රතිපත්තිමය අවිනිශ්චිතතා මධ්‍යයේ වුවද, ඇමරිකා එක්සත් ජනපදය ශ්‍රී ලංකාවේ **තෙවැනි විශාලතම වෙළඳ හවුල්කරුවා** ලෙස පසුවන අතර, එය ශ්‍රී ලංකාවේ මුළු අපනයන පංගුවෙන් 22.1% කට හිමිකම් කියයි,.
මූලාශ්‍රයන්ට අනුව ඇමරිකා එක්සත් ජනපදයෙන් ලැබූ වාර්ෂික අපනයන ආදායම් අගයන් පහත පරිදි වේ:

| වර්ෂය | අපනයන අගය (ඇමරිකානු ඩොලර් මිලියන) |
|---|---|
| 2025 | 3,000 |
| 2024 | 2,911 |
| 2023 | 2,769 |
| 2022 | 3,321 |
| 2021 | 3,108 |

**වැදගත් නිරීක්ෂණ:**

- **ප්‍රධාන අපනයන කාණ්ඩ:** රෙදිපිළි සහ ඇඟලුම් ඇමරිකා එක්සත් ජනපදය වෙත සිදුකරන ප්‍රධානතම අපනයන කාණ්ඩය ලෙස තවදුරටත් පවතී,. 2025 වසරේදී මෙම කාණ්ඩයේ අපනයන 2.1% කින් වර්ධනය වී ඇත.
- **වෙළඳ අතිරික්තය:** ශ්‍රී ලංකාව ඇමරිකා එක්සත් ජනපදය සමඟ **ඇමරිකානු ඩොලර් බිලියන 2.5 ක සැලකිය යුතු වෙළඳ අතිරික්තයක්** පවත්වාගෙන ගොස් ඇත.

| | 2024 | 2025 |
|---|---|---|
| ඇමරිකා එක්සත් ජනපදය වෙත සිදුකරන **අපනයන** | 22.8 % | 22.1% |
| ඇමරිකා එක්සත් ජනපදය **මෙරටට ආනයන** | 2.4% | 2.5% |

(ලකුණු 01)

(නිවැරදි කරුණු 4 - ලකුණු 04)



www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers · Model Answers · Study Resources

(iv)

- **(අ) ආධාර ලෙස භාණ්ඩ තොග ලැබීම:** ද්විතීයික ආදායම් ගිණුම (බැර) සහ ජංගම ගිණුම/භාණ්ඩ ගිණුම (හර).
- **(ආ) ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් (IMF) ණයක් ලැබීම:** මූල්‍ය ගිණුම - වනත්අොයාර්ජන ණයගිණුමබැර / මූල්‍ය ගිණුම - මුදල් හා තැන්පතු ගිණුම (හර).
- **(ඇ) ඩොලර් සංචිත භාවිතා කර රන් මිලදී ගැනීම:** සංචිත වත්කම් - රන් සංචිත වැඩිවීම (හර) සහ මූල්‍ය ගිණුම - මුදල් හා තැන්පතු ගිණුම (බැර).
- **(ඇ) විදේශයක සිටින පුද්ගලයෙකු තම මවට වැටුප් එවීම:** ද්විතීයික ආදායම් ගිණුම/පෞද්ගලික මාරු කිරීම් (බැර) සහ මුදල් හා තැන්පතු ගිණුම (හර).

(v) මැදපෙරදිග යුද්ධය නිසා බොරතෙල් මිල ඉහළ යාම රුපියලේ විදේශ අගයට කරන බලපෑම.

බොරතෙල් මිල ඉහළ යාම නිසා ශ්‍රී ලංකාවේ ආනයන වියදම ඉහළ යයි. මෙවිට විදේශ විනිමය සඳහා පවතින **ඉල්ලුම ඉහළ යන** බැවින් ඉල්ලුම් වක්‍රය දකුණට විතැන් වේ. ප්‍රස්ථාරිකව දැක්වීමේදී, විදේශ විනිමය වෙළඳපොළේ සමතුලිත මිල (විනිමය අනුපාතිකය) ඉහළ යන අතර මෙහිදී රුපියලේ බාහිර අගය **අවප්‍රමාණය (Depreciation)** වේ.

(ශ්‍රී ලංකාව යනු බොරතෙල් ආනයනය මත බෙහෙවින් යැපෙන රටකි. මැදපෙරදිග යුදමය තත්ත්වයක් නිසා ලෝක වෙළඳපොළේ බොරතෙල් මිල ඉහළ ගිය විට, එම තෙල් ප්‍රමාණයම ආනයනය කිරීමට පෙරට වඩා වැඩි විදේශ විනිමය (ඩොලර්) ප්‍රමාණයක් වැය කිරීමට රජයට සිදු වේ. මෙහි ප්‍රතිඵලයක් ලෙස රටේ **සමස්ත ආනයන වියදම ඉහළ යයි.**

විදේශ විනිමය වෙළඳපොළ තුළ ඩොලර් සඳහා පවතින ඉල්ලුම තීරණය වන්නේ ආනයන වියදම් වැනි සාධක මතය.

- බොරතෙල් මිල ඉහළ යාම නිසා විදේශ විනිමය සඳහා පවතින **ඉල්ලුම ඉහළ යයි.**
- මෙහිදී විදේශ විනිමය ඉල්ලුම් වක්‍රය **දකුණටවිතැන් වේ.**

ඩොලරයක රුපියල් අගය මෙසේ ඉහළ යාම යනු **රුපියලේ බාහිර අගය අවප්‍රමාණය වීම (Depreciation)** වේ.)

(ලකුණු 04)

9. (i) "ආර්ථික වර්ධනය ප්‍රමාණාත්මක සංකල්පයක් වන අතර ආර්ථික සංවර්ධනය ගුණාත්මක සංකල්පයකි." පහදන්න. (ලකුණු 4)
 (ii) "තිරසාර සංවර්ධනය" සංකල්පය පැහැදිලි කරන්න. (ලකුණු 4)
 (iii) ආර්ථික වර්ධනයේ පිරිවැය සඳහන් කරන්න. (ලකුණු 4)
 (iv) මානව සංවර්ධන දර්ශකයේ ශක්තීන් නම් කරන්න. (ලකුණු 4)
 (v) දුගීබව තුරන් කිරීමේ ක්‍රියාවලියේදී ශ්‍රී ලංකාව මුහුණ පාන ගැටළු කවරේද? (ලකුණු 4)

(i)

- ආර්ථික **වර්ධනය (Economic Growth):** මෙයින් අදහස් වන්නේ යම් නිශ්චිත කාලසීමාවක් තුළ රටක නිෂ්පාදනය කරන සමස්ත භාණ්ඩ හා සේවා ප්‍රමාණය හෙවත් සැබෑ දළ දේශීය නිෂ්පාදිතය (Real GDP) ඉහළ යාමයි. මෙය දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධන වේගය හෝ ඒක පුද්ගල ආදායම වැනි සංඛ්‍යාත්මක දර්ශක මගින් නිවැරදිව මැනිය හැකි බැවින්, එය **ප්‍රමාණාත්මක සංකල්පයක්** ලෙස හැඳින්වේ. මෙහිදී මූලිකවම අවධානය යොමු වන්නේ රටේ නිෂ්පාදන ධාරිතාවය වැඩි වීම කෙරෙහි පමණි.
- ආර්ථික **සංවර්ධනය (Economic Development):** ආර්ථික සංවර්ධනය යනු ආර්ථික වර්ධනයට වඩා පුළුල් සංකල්පයකි. මෙයට ආර්ථික වර්ධනය (නිෂ්පාදනය වැඩි වීම) පමණක් නොව, ඒ සමඟම රටේ ආර්ථික, සමාජීය සහ ව්‍යුහාත්මක අංශවල සිදුවන හිතකර වෙනස්කම් ද ඇතුළත් වේ. ජනතාවගේ ජීවන තත්ත්වය උසස් වීම,



www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

දරිද්‍රතාවය සහ විරැකියාව තුරන් වීම, ආදායම් විෂමතාවය අඩු වීම සහ අධ්‍යාපන හා සෞඛ්‍ය මට්ටම් ඉහළ යාම වැනි මිනිස් ජීවිතයේ යහපැවැත්ම කෙරෙහි බලපාන සාධක මෙහිදී සලකා බලනු ලබයි. මෙම වෙනස්කම් හුදෙක් සංඛ්‍යාත්මකව පමණක් නොව ගුණාත්මකව මැනිය යුතු බැවින් මෙය **ගුණාත්මක සංකල්පයක්** ලෙස හැඳින්වේ.

**සංසන්දනාත්මක සාරාංශය:** ආර්ථික වර්ධනය යනු ආර්ථිකයේ 'ප්‍රමාණය' විශාල වීම පෙන්නුම් කරන පටු සංකල්පයක් වන අතර, ආර්ථික සංවර්ධනය යනු එම වර්ධනයේ ප්‍රතිලාභ ජනතාව වෙත ළඟා වී ඔවුන්ගේ සමස්ත ජීවන තත්ත්වය 'ගුණාත්මකව' වර්ධනය වීම පෙන්නුම් කරන පුළුල් සංකල්පයකි. (ලකුණු 04)

**(ii) තිරසාර සංවර්ධනය** යනු අනාගත පරම්පරාවට ඔවුන්ගේ අවශ්‍යතා සපුරා ගැනීමට ඇති හැකියාවට හානියක් නොවන අයුරින්, වර්තමාන පරම්පරාවේ අවශ්‍යතා සපුරා ගැනීමයි. මෙහිදී ආර්ථික සංවර්ධනය, පරිසර ආරක්ෂණය සහ සමාජ සාධාරණත්වය යන අංශ තුන අතර සමතුලිතතාවයක් පවත්වා ගැනීම අපේක්ෂා කෙරේ.

තිරසාර සංවර්ධනය යනු හුදෙක් පරිසරය රැක ගැනීම පමණක් නොව, අංශ තුනක එකතුවකි:

- ආර්ථික **තිරසාරභාවය (Economic Sustainability):** ආර්ථික වර්ධනය අඛණ්ඩව පවත්වා ගැනීම, සම්පත් කාර්යක්ෂමව භාවිත කිරීම සහ සියලු දෙනාට ආර්ථික ප්‍රතිලාභ ලැබෙන ක්‍රමවේදයක් පවත්වා ගැනීම.
- **සමාජීය තිරසාරභාවය (Social Sustainability):** සමාජ සාධාරණත්වය ඇති කිරීම, දරිද්‍රතාවය තුරන් කිරීම, අධ්‍යාපන හා සෞඛ්‍ය පහසුකම් සැමට ලබා දීම සහ මානව අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.
- **පාරිසරික තිරසාරභාවය (Environmental Sustainability):** ස්වභාවික සම්පත් ක්ෂය වීම වැළැක්වීම, ජෛව විවිධත්වය ආරක්ෂා කිරීම, දූෂණය පාලනය කිරීම සහ පරිසර පද්ධතිවල සමතුලිතතාවය පවත්වා ගැනීම.

ප්‍රධාන ලක්ෂණ සහ වැදගත්කම

- **අන්තර් පරම්පරා සාධාරණත්වය (Inter-generational Equity):** වර්තමාන පරම්පරාව සම්පත් භුක්ති විඳීමේදී අනාගත පරම්පරාවට ද එම සම්පත් උරුම කර දීමට වගබලා ගැනීම මෙහි මූලික පදනමයි.
- **සම්පත් කළමනාකරණය:** පුනර්ජනනීය නොවන සම්පත් (උදා: ඛනිජ තෙල්) අරපිරිමැස්මෙන් භාවිත කිරීම සහ පුනර්ජනනීය සම්පත් (උදා: සූර්ය බලය, සුළං බලය) කෙරෙහි වැඩි අවධානයක් යොමු කිරීම.
- **දිගුකාලීන දැක්ම:** ක්ෂණික ලාභ ලැබීමට වඩා දිගුකාලීන මානව යහපැවැත්ම කෙරෙහි අවධානය යොමු කරයි.

**සාරාංශය:** තිරසාර සංවර්ධනය යනු ආර්ථික **වර්ධනය, සමාජ සාධාරණත්වය සහ පාරිසරික ආරක්ෂණය** යන අංශ තුන අතර මනා සමතුලිතතාවයක් පවත්වා ගනිමින් සිදු කරනු ලබන සංවර්ධන ක්‍රියාවලියයි. මෙය හුදෙක් ධනය රැස් කිරීමෙන් ඔබ්බට ගිය, මිහිතලයේ සහ මානව වර්ගයාගේ අනාගත පැවැත්ම තීරණය කරන සංකල්පයකි. (ලකුණු 04)

**(iii)** ආර්ථික වර්ධනයක් සිදුවන විට සමාජයට දැරීමට සිදුවන අහිතකර බලපෑම් මෙයින් අදහස් වේ:

1. **ස්වභාවික සම්පත් ක්ෂය වීම:** නිෂ්පාදනය වැඩි කිරීම සඳහා සම්පත් අධික ලෙස භාවිත කිරීම.
2. **පාරිසරික දූෂණය:** කාර්මීකරණය සමඟ ඇතිවන වායු, ජල සහ ශබ්ද දූෂණය.
3. **ආදායම් විෂමතාවය:** වර්ධනයේ ප්‍රතිලාභ සමාජයේ ඉහළ ස්ථරයට පමණක් සීමා වීම.
4. **සංස්කෘතික පිරිහීම:** කාර්යබහුල ජීවන රටාව නිසා පවුල් සබඳතා සහ සදාචාරාත්මක වටිනාකම් දුර්වල වීම.

(නිවැරදි කරුණු 4 ලකුණු 04)

(iv) මානව සංවර්ධන දර්ශකයේ (HDI) ශක්තීන්

1. ආර්ථික වර්ධනය මැනීමට හුදෙක් GDP අගයට වඩා **පුළුල් මිනුම්දණ්ඩක්** වීම.
2. **සෞඛ්‍යය** (උපතේදී ආයු අපේක්ෂාව) සහ **අධ්‍යාපනය** (සාමාන්‍ය සහ අපේක්ෂිත පාසල් වසර) වැනි මූලික මානව අවශ්‍යතා කෙරෙහි අවධානය යොමු කිරීම.
3. රටවල් අතර සංවර්ධන මට්ටම් **ජාත්‍යන්තරව සංසන්දනය කිරීම** සඳහා පිළිගත් සහ පහසු මිනුමක් වීම.

(ලකුණු 04)



www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers · Model Answers · Study Resources

(v) දුගීබව තුරන් කිරීමේ ක්‍රියාවලියේදී ශ්‍රී ලංකාව මුහුණ පාන ගැටළු

**1. සහනාධාර ඉලක්කගත කිරීමේ පවතින දෝෂ (Targeting Errors):** දුප්පතුන් සඳහා ක්‍රියාත්මක කරන සමෘද්ධි හෝ අස්වැසුම වැනි වැඩසටහන්වලදී ප්‍රධාන ගැටළු දෙකක් මතු වේ:

- **ඇතුළත් කිරීමේ දෝෂ (Inclusion Errors):** සැබවින්ම දුප්පත් නොවන පිරිස් දේශපාලන සම්බන්ධතා හෝ වැරදි තොරතුරු මත සහනාධාර ලැයිස්තුවට ඇතුළත් වීම.
- **බැහැර කිරීමේ දෝෂ (Exclusion Errors):** අන්ත දුප්පත්කමේ සිටින, සහනාධාර අත්‍යවශ්‍ය පිරිස් තාක්ෂණික හෝ පරිපාලනමය ගැටළු නිසා සහනාධාරවලින් බැහැර වීම.

**2. යැපීම් මානසිකත්වය ඇති වීම (Dependency Syndrome):** දීඝර් කාලීනව රජයෙන් ලැබෙන මූල්‍ය ආධාර මතම යැපීමට ජනතාව හුරු වීම නිසා ඔවුන් ස්වයං රැකියා හෝ වෙනත් ආදායම් මාගර් කෙරෙහි යොමු වීමට දක්වන උනන්දුව අඩු වේ. මෙය දුගීබවෙන් මිදීමට ඇති ලොකුම බාධාවකි.

**3. ඉහළ යන උද්ධමනය සහ ජීවන වියදම:** රටේ උද්ධමනය ඉහළ යන විට, රජය ලබා දෙන ස්ථාවර සහනාධාර මුදලක සැබෑ වටිනාකම (Real Value) අඩු වේ. මේ නිසා සහනාධාර ලැබුණ ද ජනතාවට තම මූලික අවශ්‍යතා සපුරා ගැනීම දුෂ්කර වී නැවතත් දුගීබවට පත් වේ.

**4. ග්‍රාමීය අංශයේ යටිතල පහසුකම් සහ වෙළඳපොළ ප්‍රවේශය අවම වීම:** දුප්පත්කම වැඩි වශයෙන් පවතින ග්‍රාමීය ප්‍රදේශවල ජනතාව නිපදවන කෘෂිකාමරීක නිෂ්පාදන සඳහා නිසි මිලක් ලබා ගැනීමට වෙළඳපොළක් නොමැති වීම සහ ප්‍රවාහන පහසුකම් අවම වීම නිසා ඔවුන් දිගින් දිගටම දුප්පත්කමේ රැඳී සිටියි.

**5. කුසලතා සහ රැකියා වෙළඳපොළ අතර පවතින නොගැලපීම (Skills Mismatch):** දුප්පත් පවුල්වල තරුණ තරුණියන් සතු අධ්‍යාපන සහ වෘත්තීය කුසලතා වතර්මාන නවීන රැකියා වෙළඳපොළට නොගැලපීම නිසා ඔවුන්ට ඉහළ ආදායම් ලබන රැකියා ලබා ගැනීමට නොහැකි වීම දරිද්‍රතා උගුල (Poverty Trap) පවත්වා ගැනීමට හේතු වේ.

**6. රාජ්‍ය ප්‍රතිපත්තිවල අස්ථාවරභාවය:** ආණ්ඩු මාරු වීමත් සමඟ දුගීබව පිටුදැකීමේ වැඩසටහන්වල නම්, ක්‍රමවේද සහ ප්‍රතිපත්ති වෙනස් වීම නිසා දිගුකාලීන තිරසාර සංවධර්නයක් ඇති කර ගැනීමට අපහසු වේ.

( නිවැරදි කරුණු 4- ලකුණු 04)

10. (i) ශ්‍රී ලංකාව වැනි ආර්ථිකයන් පොසිල ඉන්ධන මූලාශ්‍රවල සිට පුනර්ජනනීය බලශක්ති මූලාශ්‍ර දක්වා යොමු වීමේ ආර්ථික ප්‍රතිලාභ මොනවාද? (ලකුණු 4)

(ii) ශ්‍රී ලංකාවේ ආර්ථික වර්ධන ක්‍රියාවලිය සඳහා වර්තමානයේ පවතින මැදපෙරදිග යුද්ධමය තත්වය කරනු ලබන ආර්ථික බලපෑම් කවරේද? (ලකුණු 5)

(iii) "මෑත කාලයේදී රාජ්‍ය ව්‍යවසායන්ගේ කාර්යඵලවල ධනාත්මක නැඹුරුවක් ඇත." ශ්‍රී ලංකාවේ රාජ්‍ය ව්‍යවසායන් සඳහා ඇති පොදු විවේචන මොනවාද? (ලකුණු 5)

(iv) පසුගිය වසර කිහිපයේදී ශ්‍රී ලංකාවේ විදේශ විනිමය සංචිත ඉහළ ගොස් ඇත.

(අ) රටක විදේශ විනිමය සංචිත යනු මොනවාද? (ලකුණු 1)

(ආ) ශ්‍රී ලංකාවේ විදේශ විනිමය සංචිතවල සංයුතිය දක්වන්න. (ලකුණු 2)

(ඇ) ශ්‍රී ලංකාවේ ජීවත්වන මිනිසුන්ගේ ජීවන තත්ත්වය කෙරෙහි විදේශ විනිමය සංචිතවල වැඩිවීම කරනු ලබන ධනාත්මක බලපෑම් මොනවා ද? (ලකුණු 3)


iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers · Model Answers · Study Resources

(i) ශ්‍රී ලංකාව වැනි ආර්ථිකයන් පොසිල ඉන්ධන මූලාශ්‍රවල සිට පුනර්ජනනීය බලශක්ති මූලාශ්‍ර දක්වා යොමු වීමේ ආර්ථික ප්‍රතිලාභ:

- **විදේශ විනිමය ඉතිරි වීම:** ශ්‍රී ලංකාව බොරතෙල් සහ ගල්අඟුරු ආනයනය සඳහා විශාල විදේශ විනිමය ප්‍රමාණයක් වැය කරයි. සූර්ය බලය හෝ සුළං බලය වැනි දේශීය පුනර්ජනනීය මූලාශ්‍රවලට යොමු වීමෙන් මෙම ආනයන වියදම් අඩු කරගත හැකිය.
- **බලශක්ති සුරක්ෂිතතාවය (Energy Security):** ලෝක වෙළඳපොළේ තෙල් මිල උච්චාවචනයන් මත යැපීම අඩු කරමින්, රට තුළම බලශක්තිය නිපදවා ගැනීම හරහා ස්ථාවර සැපයුමක් සහතික කළ හැකිය.
- **නිෂ්පාදන පිරිවැය අඩු වීම:** දිගුකාලීනව බලශක්ති පිරිවැය අඩුවීම හරහා කර්මාන්ත ශාලාවල නිෂ්පාදන පිරිවැය අඩු වන අතර එය ජාත්‍යන්තර වෙළඳපොළේ තරගකාරී වීමට උපකාරී වේ.
- **පාරිසරික තිරසාරභාවය:** හරිතාගාර වායු විමෝචනය අඩු වීම නිසා පාරිසරික පිරිවැය (External Costs) අවම වන අතර තිරසාර සංවර්ධනයක් කරා ගමන් කළ හැකිය. (ලකුණු 04)

(ii) ශ්‍රී ලංකාවේ ආර්ථික වර්ධන ක්‍රියාවලිය සඳහා වර්තමානයේ පවතින මැදපෙරදිග යුද්ධය ඇති කරන ආර්ථික බලපෑම්:

- **ආනයනික පිරිවැය තල්ලු කළ උද්ධමනය:** යුද්ධය නිසා බොරතෙල් මිල ඉහළ යන අතර, එය ප්‍රවාහන හා නිෂ්පාදන වියදම් වැඩි කරමින් රට තුළ බඩු මිල ඉහළ යාමට (උද්ධමනයට) හේතු වේ.
- **අපනයන ආදායම අඩුවීම:** මැදපෙරදිග යනු ශ්‍රී ලංකාවේ තේ සඳහා පවතින ප්‍රධානතම වෙළඳපොළකි. යුදමය තත්ත්වය නිසා තේ අපනයනයට බාධා පැමිණ විදේශ විනිමය ආදායම අඩු විය හැකිය.
- **විදේශ ප්‍රේෂණ (Remittances) අඩුවීම:** මැදපෙරදිග රටවල සේවය කරන ලාංකික ශ්‍රමිකයන්ගේ රැකියා සුරක්ෂිතතාවයට බලපෑම් ඇති වුවහොත්, රටට ලැබෙන ප්‍රධානතම විදේශ විනිමය මාර්ගයක් වන ශ්‍රමික ප්‍රේෂණ පහත වැටිය හැකිය.
- **ආයෝජන සහ සංචාරක කර්මාන්තය:** කලාපීය අස්ථාවරත්වය නිසා විදේශ ආයෝජකයන් සහ සංචාරකයන් පැමිණීමට දක්වන උනන්දුව අඩු වීම ආර්ථික වර්ධනයට බාධාවකි. (ලකුණු 04)

(iii) ශ්‍රී ලංකාවේ රාජ්‍ය ව්‍යවසායයන් (SOEs) සඳහා පවතින පොදු විවේචන:

- **අකාර්යක්ෂම කළමනාකරණය:** බොහෝ රාජ්‍ය ආයතන ලාභ ලැබීම වෙනුවට පාඩු ලබන තත්ත්වයක පවතින්නේ නුසුදුසු කළමනාකරණය සහ නවීන තාක්ෂණය භාවිත නොකිරීම හේතුවෙනි.
- **දේශපාලන මැදිහත්වීම:** තීරණ ගැනීමේ ක්‍රියාවලියේදී සහ සේවකයන් බඳවා ගැනීමේදී සිදුවන අනිසි දේශපාලන බලපෑම් නිසා ආයතනික විනය පිරිහී ඇත.
- **මූල්‍ය බරක් වීම:** පාඩු ලබන රාජ්‍ය ආයතන නඩත්තු කිරීමට රජයේ මූල්‍ය ප්‍රතිපාදන වැය කිරීමට සිදුවීම නිසා අයවැය හිඟය තවදුරටත් ඉහළ යයි.
- **සේවක අතිරික්තය:** අවශ්‍ය ප්‍රමාණයට වඩා වැඩි පිරිසක් සේවයේ යොදවා ගැනීම නිසා ශ්‍රම ඵලදායිතාවය අඩු වී පිරිවැය ඉහළ ගොස් ඇත. (ලකුණු 04)

(iv) විදේශ විනිමය සංචිත:

- **(අ) විදේශ විනිමය සංචිත යනු:** රටක මහ බැංකුව සතුව පවතින, ජාත්‍යන්තර ගෙවීම් සඳහා භාවිතා කළ හැකි ද්‍රවශීල විදේශ වත්කම් වේ.
- **(ආ) සංයුතිය:** විදේශ මුදල් වත්කම් (Forex), විශේෂ ගැනුම් හිමිකම් (SDRs), ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (IMF) සතු සංචිත තත්ත්වය සහ රන් සංචිත මෙයට ඇතුළත් වේ.
- **(ඇ) ජීවන තත්ත්වය කෙරෙහි ධනාත්මක බලපෑම:**
    1. **විනිමය අනුපාතිකය ස්ථාවර වීම:** සංචිත වැඩි වූ විට රුපියලේ අගය ශක්තිමත් වන අතර එමගින් ආනයනික භාණ්ඩවල මිල අඩු වී ජනතාවගේ ජීවන වියදම පාලනය වේ.
    2. **අත්‍යවශ්‍ය ද්‍රව්‍ය සැපයීම:** ආහාර, ඖෂධ, ඉන්ධන සහ ගෑස් වැනි අත්‍යවශ්‍ය ද්‍රව්‍ය හිඟයකින් තොරව ආනයනය කිරීමට හැකි වීමෙන් ජනතාවගේ මූලික අවශ්‍යතා සපුරා ගත හැකිය.
    3. ආර්ථික **විශ්වාසය:** විදේශ සංචිත ශක්තිමත් වීම හරහා ආයෝජක විශ්වාසය ගොඩනැගෙන බැවින් නව රැකියා අවස්ථා බිහි වී ජනතාවගේ ආදායම් මට්ටම ඉහළ යයි. (ලකුණු 04)

PAST PAPERS WIKI